චම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

ISSN 3121-3529

12 කාණ්ඩය 08 කලාපය

2026 ඔක්තෝබර්

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු 70.00



03 ප්‍රංශ ශිෂ්‍ය අරගලය මෙතැනින් කොතැනටද?


05 වසරේ මුල් මාස හය තුළ කෝටි 1500ක රණ් භාණ්ඩ උගසට


09 ඔක්තෝබර් විප්ලවය වත්මන් විප්ලවයේ මග සලකුණක් ලෙස


10 වැල යන අතට මැස්ස ගැසීම

රාජ්‍ය ත්‍රස්තවාදී පනත හකුළා ගනු!

ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත PSTA නමින් ආණ්ඩුව නව ජනතා මර්දන පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේ.

මෙම පනත සකසා ඇත්තේ සියලු මානව හිමිකම් කඩ කරමින් රටේ සමස්ත ජනතාව රාජ්‍යයේ සෘජු මර්දනයට ලක් කළ හැකි බලයක් ආණ්ඩුවට ලබා ගැනීමට බව පැහැදිලිවම පෙනේ.

ලිබරල් නෛතික පදනම් වල අවම සමාජ වගකීම් තුළ වුවද පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ, රඳවා ගැනීමේ, හා විනිශ්චය කිරීමේ බලය මෙතෙක් ලබාදී තිබුනේ ව්‍යවස්ථාපිත අධිකරණ පද්ධතියට පමණකි. එහෙත් මෙම නව පනතෙන් ජනාධිපතිවරයා ආරක්ෂක ලේකම් නීතිපති වැනි තනි පුද්ගලයන්ට තම අභිමතය පරිදි අත්තනෝමතික ලෙස එම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ අයිතිය පවරා දී තිබේ. ඒ අනුව ඕනෑම පුරවැසියෙක් ත්‍රස්තවාදියෙක් ලෙස සලකා අත් අඩංගුවටගෙන වසරක කාලයක් දක්වා රඳවා ගැනීමේ හැකියාව ද ඔවුන්ට ලැබෙයි.

ඕනෑම පුද්ගලයෙකුගේ භාෂණයේ ලේඛනයේ හා ප්‍රකාශනයේ අයිතිය වසර 20ක් දක්වා කාලයකට අහිමි කර ස්වයං නිවාස අඩස්සියේ තබන බවට තර්ජනය කිරීමේ බලයද මේ සමගම නීති ගත කර තිබේ. තමන්ට අභියෝගයක් වන ඕනෑම සංවිධානයක් තම අභිමතය මත තහනම් කිරීමේ බලයද ජනාපතිවරයා සතුකර ගෙන තිබේ.

ආර්ථික වශයෙන් ඉතා අස්ථාවර තත්වයක තිබෙන මෙරට සමාජයෙන් එල්ල විය හැකි රාජ්‍ය විරෝධී උද්ඝෝෂණ තිරස්චීන ලෙස මර්දනය කිරීම මෙහි මූලික අරමුණ බව පැහැදිලි ය.

මෙම ජනතා විරෝධී පනත පරාජය කිරීම සඳහා සියලු වැඩ කරන ජනතාවට වහ වහා සංවිධානය වන ලෙස පෙරටුගාමී සමාජවාදී පක්ෂය ඉල්ලා සිටී.

තරුණ විරැකියාව 17% ඉක්මවා යයි.

2026 වසරේ දෙවැනි කාර්තුව අවසන් වන විට ලංකාවේ තරුණ තරුණ රැකියා වියුක්තිය 17.8% ක් බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වාර්තා කරයි.

එම වාර්තාව අනුව තරුණ කාන්තාවන් අතර විරැකියාව 22.4%ක් වැනි ඉහල අගයකට වර්ධනය වී ඇති අතර තරුණ පිරිමින් අතර විරැකියාව 15.5%ක් වේ.

එම වාර්තාව තවදුරටත් පෙන්වා දෙන්නේ වයස අවුරුදු 25-29 අතර තරුණ පිරිස්වල විරැකියා ප්‍රතිශතය 12.1% ක් බවයි. මෙහිදී ද මෙම වයස් කාණ්ඩයේ පිරිමින්ගෙන් 7.7%ක් හා කාන්තාවන්ගෙන් 19.7%ක් රැකියා වෙළඳපොළට අභිමුඛ නොවේ.

අ.පොස.(උ/පෙ) හෝ ඉන් ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත තරුණ පිරිස් 6.7%ක් විරැකියාවෙන් පෙළෙති. එය කාන්තාවන්ගෙන් 9.6%ක් හා පිරිමින්ගෙන් 3.9%කි.

ඉන්ධන මිල තීරණය කිරීමේ අයිතිය සමාගම් ඉල්ලයි

තම ඉන්ධනහල්වලදී ඉන්ධන අලෙවි කරන මිල ගණන් තීරණය කිරීමට තම ස්වාධීන අවස්ථාව සලසා දෙන ලෙස විදෙස් ඉන්ධන සැපයුම් සමාගම් තුනක් ආණ්ඩුවෙන් ඉල්ලා තිබේ.

ඉන්දියන් ඔයිල් සමාගම, සයිනොපෙක් සමාගම සහ පී.එම්. පාක්ස් සමාගම මෙම ඉල්ලීම් කර තිබේ. මෙරට ඉන්ධන සැපයුමෙන් 35%ක් දැනටමත් ඔවුන් විසින් අත්පත් කරගෙන තිබේ. ගෝලීය ඉන්ධන වෙළඳපොලේ මිල ගණන් අනුව යමින් දේශීය වෙළෙඳපොලේ ඉන්ධන මිල ගණන් තීරණය කිරීමේ සිය අභිමතය මෙම ඉල්ලීම සමග ඔවුන් එළිදක්වා තිබේ. ඒ සඳහා බලශක්ති අමාත්‍යාංශයේ ඉන්ධන මිල ගණනය කිරීම් තමන් වෙත කාර්යක්ෂම ලෙස ලබාදීමේ සන්නිවේදන ක්‍රියාවලියක් අවශ්‍ය බව ඔවුන් ප්‍රකාශ කරයි. ඒ අනුව ඔවුන්ගේ මිල ගණන් සැකසීමට හැකි බව මෙහි මතුපිටින් ප්‍රකාශිත අරමුණයි.

ඉන්ධන මිල ගණන් තීරණය කිරීමේ අයිතිය දැනටමත් ඔවුන් සතු බව බලශක්ති අමාත්‍යාශයද පිළිගනියි. එහෙත් ආණ්ඩුවේ මිල ගණනයන් අනුගමනය කිරීමට ඔවුන්ට සිදුව තිබේ. ඒ වෙනුවට සමාගම්වල ඉල්ලීමට අනුව ආණ්ඩුවේ මිල ගණන් සැකසීම මෙහිදී සිදුවනු ඇත. රටේ ජනතාවගේ ඉන්ධන අවශ්‍යතා සම්බන්ධව කිසිදු වගකීමක් එම සමාගම් දරන්නේ නැත.

රාජ්‍ය ඒකාධිකාරයක් ලෙස පැවති මෙරට ඉන්ධන බෙදා හැරීම බහුජාතික සමාගම් වෙත පවරාදීමේදී තරගකාරීත්වය නිසා මෙරට ඉන්ධන මිල පහත වැටෙනු ඇතැයි විශ්වාස කෙරිණි.

ඉන්දියාවේ හා යුරෝපයේ ශිෂ්‍ය අරගල රැල්ලක්





ඉන්දිය ශිෂ්‍යයන්, එරට ඡන්දහිමි නාම ලේඛණ භාරතීය ජනතා පක්ෂයට වාසිදායක ලෙස සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විරෝධය පළ කරන්නට සටන්කාමී ලෙස වීදි බැස ඇති අතර ප්‍රංශය ඇතුළු යුරෝපා රටවල ශිෂ්‍යයන් රාජ්‍ය අධ්‍යාපනයට අරමුදල් වැඩි කරන ලෙස ඉල්ලා සටන් කරමින් සිටී.

සූර්ය බලශක්තියේ ජනතා සහභාගීත්වය අවසන් කරන්නේ කා වෙනුවෙන්ද?

2026 සැප්තැම්බර් 11 වැනිදා නිකුත් කරන ලද චක්‍රලේඛය ඔස්සේ සූර්ය බලශක්තිය අධෛර්යමත් කිරීම සම්බන්ධයෙන් ඔක්තෝබර් 5වන දින පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මාධ්‍ය හමුවක් පක්ෂයේ නුගේගොඩ කාර්යාලයේදී පැවැත්විණි. එහිදී පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ අධ්‍යාපන ලේකම් පුබුදු ජයගොඩ සහෝදරයා දැක්වූ අදහස්වල කෙටි සටහනක් පහත පළ වේ.

"රටේ සාමාන්‍ය ජනතාව සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සූර්ය බලශක්තිය ජනනය කිරීම අධෛර්යමත් කිරීම් සඳහා මේ ආණ්ඩුව චක්‍රලේඛ දෙකක් නිකුත් කරනු ලැබුවා. සූර්ය බලශක්තිය ආකාර කිහිපයකට ලබා ගන්නවා. පියසි මත සූර්ය පැනල, පොළොවේ සවි කරන ලද සූර්ය පැනල සහ පාවෙන සූර්ය පැනල ඒ ප්‍රධාන ආකාර තුන.

මේ අතරින් දෙවන සහ තුන්වන ක්‍රමවලින් විදුලි ජනනය කරන්නේ ඒකාධිකාර සමාගම් සහ මහා පරිමාණ නිෂ්පාදකයන්. පළමු ක්‍රමය තමයි සාමාන්‍ය ජනතාව සහ සුළු පරිමාණ නිෂ්පාදකයන් විසින් අනුගමනය කරන්නේ. ඒ පියසි මත සූර්ය පැනල සඳහා ක්‍රම හතරක් තිබුණා. Net Net Accounting, Net Metering, Net Plus Net Plus සහ Net Plus Plus නමින් එම ක්‍රම හතර නම් කර තිබුණා. මේ ආණ්ඩුව මුලින්ම 2025 පෙබරවාරියේ රිලවා පැනීමේ නාඩගමක් පෙන්වා 2025 මාර්තු 17 වැනිදා චක්‍රලේඛයක් නිකුත් කර Net Plus Plus ක්‍රමය අහෝසි කළා. දැන් 2026 සැප්තැම්බර් 11 වැනිදා දිනැති චක්‍රලේඛය මගින් Net Accounting හා Net Metering ක්‍රම දෙකත් නතර කරලා. දැන් ඉතිරි Net Plus ක්‍රමය පමණයි. මෙය පැහැදිලිවම සූර්ය බලශක්තිය ජනනය කිරීම සඳහා සාමාන්‍ය ජනතාව සහ සුළු නිෂ්පාදකයන් අධෛර්යමත් කිරීමක් බව පැහැදිලියි.

දැනට සූර්ය පැනල හරහා විදුලි ජනනය කරන සම්බන්ධතාවලින් 70.2% ක්ම Net Accounting, 14.0%ක් Net Metering 12.7%ක් Net Plus Plus. ඒ ක්‍රම තුනම අහෝසි කර ඉතිරි කර තිබෙන Net Plus ක්‍රමයේ සම්බන්ධතා තිබෙන්නේ 3.1%ක් පමණයි. එයින් පෙනෙන්නේ එය ඉතිරි කළාට ජනතාවට එම ක්‍රමයට විදුලි ජනනය කිරීමේ හැකියාව අඩු බව. මේ ක්‍රමයේදී නිවසක හෝ කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන සමස්ත විදුලි ප්‍රමාණය ජාතික විදුලි බල පද්ධතියට විකුණා තමන්ගේ විදුලි බිල වෙනම ගෙවිය යුතුයි. ඒ වගේම Net Plus Plus ක්‍රමයේදී මෙන් රාත්‍රියට වැඩි මුදලක් ගෙවීම සිදු වන්නේත් නෑ. අනෙක් අතට 3.1%ක් සම්බන්ධතා ප්‍රතිශතයකින් සමස්ත ධාරිතාවයෙන් 11.3%ක් නිෂ්පාදනය කරලා. ඒ කියන්නේ මේවා වැඩි විදුලි ජනනයක් කරන, සාමාන්‍ය නිවෙසක සවි කළ නොහැකි, ඇතැම් විට 60Kv වැනි විය හැකි විශාල ඒවා. මේ අනුව එක පැත්තකින් පියසි මත සූර්ය පැනල වෙනුවට පොළොවේ සවි කරන ලද සහ පාවෙන පැනල වැඩි කිරීම හරහාත්, අනෙක් පැත්තෙන් පියසි මත සූර්ය පැනලවලත් විශාල සමාගම්වලට පමණක් කළ හැකි ක්‍රමය ඉතිරි කර ජනතාව වැඩිපුර භාවිතා කළ ක්‍රම තහනම් කිරීම හරහාත් මේ ක්ෂේත්‍රය ඒකාධිකාර සමාගම්වල බූදලයක් කරන්න ආණ්ඩුව සූදානම් වෙන්නේ. මේ ආණ්ඩුව නිර්ලජ්ජ කිව්වාට පුනර්ජනනීය විදුලි බල ජනනයෙන් නිර්ලජ්ජාව පලවා හැර එය ප්‍රභූන්ගේ ආධිපත්‍යයට සහ ඒකාධිකාරයට ගොදුරු කරන්න යන්නේ.



2013දී මෙගා වොට් 3.35 ප්‍රමාණයේ තිබූ සූර්ය විදුලි බල ජනනය 2026 වනවිට මෙගා වොට් 2502 දක්වා වැඩිවී තිබෙනවා. ඒ මුළුමනින්ම ජනතාවගේ මැදිහත්වීමෙන්. රජයේ මුදල් සතයක් වියදම් නොකර තමන්ගේ පෞද්ගලික මුදලින් 2024 වසරේදී පමණක් පියසි මත සූර්ය පැනල හරහා මෙගා වොට් 600 විදුලි බලයක් ජාතික විදුලි බල පද්ධතියට මුදා හැර තිබෙනවා. ණය අරන් ඉදිකළ නොරොච්චෝලේ බලාගාරයේ ජනන ධාරිතාවයත් මෙගා වොට් 900 පමණක් වෙද්දී වසරක් තුළ ජනතාවගේ මැදිහත්වීම කැපී පෙනෙනවා. ආණ්ඩුව මේකට කියන ලොකුම තර්කය කුඩා පරිමාණ සූර්ය පැනල නිසා පාලනය කළ නොහැකි ලෙස දිවා කාලයේදී එකවර වැඩි විදුලියක් පද්ධතියට එක්වී පද්ධති ස්ථායිතාවය නැතිවන බව. අපට අසන්නට තිබෙන සරල ප්‍රශ්න මේවා.

ජනතාව තමන් විසින්ම බැටරියක් සවිකරගෙන දිවා කාලයේ ජනනය වන විදුලිය ගබඩා කරගෙන රාත්‍රී කාලයේදී ජාතික පද්ධතියට ලබාදුන් Net Plus Plus ක්‍රමය නතර කළේ ඇයි? එමගින් ප්‍රශ්නය වැඩි වෙන්නේ නෑ, එය ප්‍රශ්නයට උත්තරයක්. නිවසේ ජනනය වන විදුලියෙන් කොටසක් තමන් භාවිතා කර ඉතිරිය පමණක් ජාතික පද්ධතියට ලබාදෙන ක්‍රම නතර කර, ජනනය වන සමස්ත විදුලි ප්‍රමාණය ජාතික පද්ධතියට මුදාහරින Net Plus ක්‍රමය ඉතිරි කිරීම පහදා දෙන තර්කය කුමක්ද? සාමාන්‍ය ජනතාව නිවසේ බැටරියක් සවි කර ගැනීම දිරිමත් කරන ලෙස බදු සහන සහ අඩු පොලී බැංකු ණය වැනි ක්‍රම ක්‍රියාත්මක කිරීම වෙනුවට 5-250Kv සුළු පරිමාණ බැටරි සඳහා 52%ක බදු අය කරන අතර මෙගාවොට් ගණන්වල සමාගම් බැටරි සඳහා බදු ශූන්‍ය කරමින් ජනතාව මේ ක්ෂේත්‍රයෙන් පලවා හරින්නේ ඇයි? ලංකාවේ වැඩිම සූර්ය බල නිෂ්පාදනය කොළඹ, ගාල්ල, ගම්පහ වැනි දිස්ත්‍රික්කවල සිදු කෙරෙද්දී එම ප්‍රදේශ වල බැටරි පද්ධති සවි කිරීම වෙනුවට ටෙන්ඩරයේ ප්‍රමුඛතාව පියසි මත සූර්ය පැනල ඉතා අඩු කිලිනොච්චි, වවුනියා, මොලොන්තැරුව, වාලච්චෙනෙයි, වවුනතිව්, මොනරාගල, අම්පාර, මහියංගනය වැනි ප්‍රදේශවලට ලබා දුන්නේ ඇයි?

ආණ්ඩුවට වැදගත් පුනර්ජනනීය බලශක්ති උත්පාදනයේ ජන සහභාගීත්වයද, සමාගම්වලට ඒකාධිකාර සකස් කිරීමද? පළමු ටෙන්ඩරයේ බැටරි පද්ධතියේ ඒකක 16කින් 13ක්ම එක සමාගමකට ලැබෙන අතර දෙවන ටෙන්ඩරයේ ඒකක 25කින් 23ක්ම වෙනත් තනි සමාගමකට ලැබීමත්, එම සමාගම් දෙකේ හිමිකරුවන් ආණ්ඩුවේ සම්පතමයන් වීමත් අතර සම්බන්ධයක් තිබේද? අප ප්‍රශ්න කළ යුතුයි!"

පිරමීඩ ජාවාරමේ අලුත්ම ගොදුර
ජනතාවගේ නිවාස සිහිනය

පිරමීඩ ජාවාරම (Pyramid Scheme) යනු අලුතින් එකතුවෙන සාමාජිකයන්ගේ මුදල් හරහා යැපෙමින් ඉහළ ප්‍රතිලාභ මවා පෙන්වමින් කරන මූල්‍ය වංචාවකි. මෙහි ඉතිහාසය වසර සියයකටත් වඩා ඈතට දිව යයි.

1988 අංක 30 දරන බැංකු පනතේ 83 (ඇ) වගන්තියේ විධිවිධානවලට අනුව ලංකාවේ ද මේ පිරමීඩ ජාවාරම තහනම් එම පනතට අනුව සෘජුව හෝ වක්‍රව තහනම් යෝජනා ක්‍රමයක් ආරම්භ කරන, අර්පනය කරන, ප්‍රවර්ධනය කරන, ප්‍රචාරණය කරන, මෙහෙයවන, මූල්‍යකරණය කරන, කළමනාකරණය හෝ විධාන කරන ඕනෑම පුද්ගලයෙක් වැරදිකරුවන් වේ.

ලංකාවේ පිරමීඩ ජාවාරමේ ඉතිහාසය 50-60 දශකය දක්වා දිවයයි .පළමුවරට එය මෙරටදී සිදු කෙරී ඇත්තේ කුඩ අලෙවියක් හරහාය . එහිදී සිදු කෙරී ඇත්තේ ආරම්භයේදී යම් නිශ්චිත මුදලක් ගෙවන පුද්ගලයෙකුට කුඩ තුනක් ලබාදීමය. ඔහු විසින් එම කුඩ තුන තවත් පුද්ගලයන් තිදෙනෙකුට අදාල ආරම්භක මුදල ලබා ගනිමින් විකිණිය යුතුය.. ඔවුන් තිදෙනාටද ඒ අනුව වෙන වෙනම කුඩ තුන බැගින් හිමි වේ. ඔවුන්ද වෙන වෙනම ඉහත කී ක්‍රමයට අනුව කටයුතු කරන විට පිරමීඩය අදහාගත නොහැකි ලෙස නිර්මාණය වේ. පිරමීඩයේ ආරම්භක පුද්ගලයන් හට මෙය මෙහෙයවන පුද්ගලයාට ලැබෙන ලාභයෙන් ලාභාංශ කොටසක් ද හිමිවේ.

AI තාක්ෂණය හරහා විදේශ විනිමය හා 'ක්‍රිප්ටෝ කරන්සි' වෙළඳාම සිදුකරන මුවාවෙන් රුපියල් බිලියන ගණනක වංචාවන් සිදු කරන ලද ජාලයේ මෙහෙයුම් ද මේ වන විට අත්හිටුවා ඇත.

මේ වන විට රට පුරා ඉමහත් ආන්දෝලනයකට ලක්වී ඇති නිවාස ගොඩනැගීමේ එක්තරා ආයතනයකට එරෙහිව මිරිහාන පොලිසියට සමණක් ඉදිරිපත් වූ පැමිණිලි 300 කට වැඩි සංඛ්‍යාවකින් (තවත් පැමිණිලි විශාල සංඛ්‍යාවක් වෙනත් පොලිසිවලටද ඉදිරිපත් ව ඇත.) කෝටි 500 කට වැඩි ජාවාරමක් ගැන හෙළිදරව් වී ඇත.

මේ පිළිබඳ සොයාබැලීමේදී හෙළිදරව් වන කරුණු ඉතාමත් බරපතලය. සමාගමක් ලියාපදිංචි කර ඇතත් එහි අධ්‍යක්ෂක මණ්ඩලයක් හෝ නොමැති වීම බරපතල සැකයකට තුඩු දෙන්නකි. කවුරුන් හෝ ඔවුන්ගෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ සිටින්නේ කවුරුන්දැයි විමසූ විට ඒ මොහොතේ සිටින තැරැව්කරුවන් පෙන්වනු හැර නිශ්චිත අධ්‍යක්ෂක මණ්ඩලයක් පෙන්වීමට ඔවුන් අපොහොසත් වේ.

මෙමගින් සිදුකරනුයේ ප්‍රචාරණ උපතුම හරහා අභිමහත් ලාභ ඉලක්ක මවා පෙන්වමින් ජනතාව රැවටීමය. මෙහිදී ඔවුන් කරනුයේ නිවසක් ඉදිකිරීමට වැයවෙන මුදලින් 25%ක් මූලිනම් ගෙවන ලෙසත් ඉතිරි 75% වසර 20ක් ඇතුලත ගෙවීමට හැකිවන ලෙසත් අදාළ ආයතනයේ නීතිඥවරයෙකු ඉදිරිපිට ගිවිසුමක් අත්සන් කිරීමය. ගිවිසුම කඩ කළහොත් දිසා අධිකරණයක නඩු පැවරිය හැකි බව එහි සඳහන් වෙතත් බොහෝ අයගේ මුදල් ලබාගෙන ඇත්තේ ගිණුම් වලට නොව අදාළ ආයතනයට මුදල් රැගෙන එන ලෙස පවසා කරන ගනුදෙනු හරහාය. අනෙක් අතට දිසා අධිකරණයක නඩුවක් වසර ගණන් ඇදෙන බව දන්නා ඔවුන් එකී සිදුරුවලින් රිංගීමට බලාගෙනම මෙම ජාවාරම්වලට සම්බන්ධ වී ඇති බව පැහැදිලිය.

නව ලිබරල් ධනවාදය සිය නග්න සූරා කෑම් කරගෙන යනුයේ මිනිසුන් තුළ විවිධාකාර වූ සිහිනයන් මවා පෙන්වමිනි. විවිධ රූපවාහිනී නාලිකා, ඔබේ නිවාසය සිහිනයක්ද පන්නයේ ප්‍රශ්නාර්ථ යොමු කරමින්, කැදැල්ල, සිරිනිවස යනාදී විවිධ නම්වලින් යුත් වැඩසටහන් ප්‍රචාරය කරනුයේ මෙවැනි ජාවාරම්කරුවන්ගෙන් ලැබෙන මුදල්වලට ඇති ගිජු කම්කිණි.

උද්ධමනය පාලනය බිඳ වැටුණේ අවාසනාව නිසා!
සහකාර මහ බැංකු අධිපති

සැප්තැම්බර් මාසයේ උද්ධමනය 8% දක්වා ඉහළ යෑම සිය ප්‍රතිපත්තිවල දුබලතාවක් නොව, පැවැති අවාසනාවන්ත තත්වයේ ප්‍රතිඵලයක් බව මහා බැංකුවේ සහකාර අධිපතිවරු වන පී.කේ.ජී. හරිශ්චන්ද්‍ර ප්‍රකාශ කරයි.

2025 ජනවාරි මාසයේදී ලංකාවේ උද්ධමනය -4% ක් වූ අතර ඉදිරි කාලය සඳහා උද්ධමනය 5% සීමාව ඉක්මවා නොයෑමට තමන් වග බලාගන්නා බව මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී සහතික විය. එසේ වුවද,මාස ගණනක් ඇතුළත මෙරට උද්ධමනය ඒකක 12කින් ඉහළ ගියේය. ඊට හේතුව ගෝලීය ආර්ථික මුහුණ දෙන ගැටලු හා අර්බුද සම්බන්ධව පුරෝකතනයක් සහිතව තම ප්‍රතිපත්ති සකස් කිරීමට මහා බැංකු අසමත් වීමයි.

එමෙන්ම ආණ්ඩුවේ වාර්ෂික අය ගීර්ෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් 16.7%ක් දක්වා රැගෙන යෑමේදී ද උද්ධමනයට වන බලපෑම ජනතාවගේ පැත්තෙන් ගණන් බැලීමට ඔවුන් පෙළඹුණේ නැත.

ඒ අතර 2016 වසරේදී 100% ලෙස සළකුණු කල මෙරට වැටුප් දර්ශකය 2026 සැප්තැම්බර් වනවිට නාමික වශයෙන් 191% ක් වනවිට වැටුපේ මූර්ත සැබෑ අගය 76.6 % දක්වා අවප්‍රමාණය වී තිබේ.

එමෙන්ම 2021 දී ඒකක 100 ක් ලෙස ගණනය කළ පාරිභෝගික මිළ දර්ශකය 2026 සැප්තැම්බර් වන විට ඒකක 208 ඉක්මවා ගොස් තිබේ.

වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත
අංක 22/1, මේල්ඩර් පෙදෙස, නුගේගොඩ.
flsocialistparty@gmail.com
wama.editor@gmail.com

ජනතා බලයක් වෙනුවෙන් විශ්වාසය ගොඩනැගීම

අධිරාජ්‍යවාදය ධනවාදයේ ඉහළම අවධිය යැයි ලෙනින් සහෝදරයා විග්‍රහ කළේ අදට වසර සියයකට පෙරය. ගෙවුණු වසර සියයකට අධික කාලයකදී අධිරාජ්‍යවාදයට බරපතල පරාජයන් හිමි වුවද ලොව පුරා සෑම බිම් අඟලක්ම ඔවුන්ගේ ග්‍රහණයට හසුවීම අවසන් නොවිය.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව නව සංවිධාන වියුහයන් ද සමගින් සිය ගමන වේගවත් කල අධිරාජ්‍යවාදය 1970 දශකයේ පසු සිය මුහුණුවර නවලිබරල් ධනවාදයට සිරුමාරු කළේය. එහිදී ලංකාවට නාමිකව ලැබුණු නිදහසත්, අන්ත පසුගාමී ආසියාතික සමාජ ශේෂයන් සහිත ධනේශ්වර ආර්ථිකයත් ධනවාදයේ සීමාවන් දක්වාවත් රැගෙන යෑමට අසමත් වූ ලංකාවේ ධනපති පන්තියට ද අධිරාජ්‍යවාදී නව ලිබරල්වාදී මංකොල්ලයට යටත් වනවා හැර අන් විකල්පයක් නොවිය.

ලෝක බැංකුවේ වැඩපිළිවෙලටත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාලීන උපදෙස්වලටත් අනුව යමින් ලංකාව සිය ආර්ථික ස්වාධිනත්වය අහිමි අසමත් රාජ්‍යයක සීමාවේ පවත්වා ගන්නට මේ පසුගාමී ධනේශ්වර පන්තියේ දේශපාලන පක්ෂ කුලකට නායකත්වයක් සපයා තිබේ. තමන්ගේම නිෂ්පාදන ආර්ථික ප්‍රතිපත්තියක් ගොඩනැගීමට අසමත් වූ ලංකාවේ පසුගාමී ධනපති පන්තියට තම අධිරාජ්‍යවාදී හාම්පුතුන්ගේ උපමානවත් සන්තර්පණය කරන්නට යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා ඇති තරම් ණය ලබාගන්නට ගන්නට ඉඩහසර විවෘත වී තිබිණි.

ඒ හා සමගම 1978 දී ආරම්භ කළ මංකොල්ලයේ ගමන අද වන විට වසර පහකට ආසන්න කාලයකදී කුටප්‍රාප්තියට ආසන්නව පවතී. අධිරාජ්‍යවාදී නිෂ්පාදන යාන්ත්‍රණයේ කුඩා වෙළඳපොළක් දක්වා ඉන්දීය සාගරයේ භූ දේශපාලන ආරක්ෂක මර්මස්ථානයක් වන ලංකාව අදගෙගොන යනු ලැබුවේ ජනතාවගේ ජීවිතවලට අවම හෝ වටිනාකමක් හෝ වග වීමක් ලබා නොදෙමිනි. නව වටිනාකම් නිපදවීමට නිෂ්පාදන ආර්ථික වැඩපිළිවෙළක් හෝ ඒ සම්බන්ධව පුළුල් සංවාදයක් හෝ ගොඩනැගීමට සමත් නායකත්වයක් ලාංකීය බෙලහීන ධනේශ්වරය සතු නොවීය. ජනතාවගේ ජීවන දුෂ්කරතා හා ආර්ථික ප්‍රහාරයන් සමග ආණ්ඩු විරෝධී තලයකින් ක්‍රියාත්මක වූ මෙරට වාමාංශික ව්‍යාපාරයන්ටද ධනේශ්වර රාජ්‍ය බලයට අභියෝග කිරීමේ ප්‍රවේශයක් සහිත වැඩපිළිවෙළක් නොවිය.

අනෙක් අතට අධිරාජ්‍ය විරෝධී වාමාංශික සංවිධාන ඇතුළතින් දිරාපත් කොට තමන්ගේ ඔඩොක්කු කුක්කන් බවට පත් කර ගැනීමේ කුලකට සී.අයි.ඒ. කෙමන ලංකාවේදීද හොඳින් අටවා දඩයම් කරගැනීමට අධිරාජ්‍යවාදීන් සමත් වී තිබේ. ඔවුන්ගෙන් සමහරුන් ආණ්ඩුවල කොටස්කාරයන් බවටත්, වර්තමානයේ දී සම්පූර්ණ ආණ්ඩුවම බවටත් පත් කර ගැනීමට අධිරාජ්‍යවාදය සමත් වී තිබේ.විය යුතු පරිදිම ඔවුන්ටද නව විකල්ප නිෂ්පාදන ආර්ථික වැඩපිළිවෙළක් තිබිය නොහැකිය.

2022 දී පැරැණි ණය කන්ද ගෙවා ගැනීමට තවත් ණය ලබා ගැනීමට නොහැකි ව ලංකාවේ ආර්ථිකය වසර හතරක ඊතියා සහන කාලයකදී පසුව යළිත් ණය ගෙවීමට නව ණය ලබා ගැනීමේ කඩඉමට රටක් ලෙස අද වන විට ප්‍රවේශ වෙමින් සිටී.

පැරණි ණය ගෙවා දමන්නේ ආර්ථිකයේ කිසියම් නාමික හෝ වර්ධනයක් ඇත්නම් එම වටිනාකම ද නව පොලි අනුපාතිකයක් බවට ප්‍රකාශ කරමින් මංකොල්ලකෑමට ණය ගිමියන්ට ඉඩ තබමිනි.

ආර්ථිකයේ වර්ධනයේ නාමික හෝ අගය පොලි ගෙවා දැමීමටද ණය වාරික ගෙවා දැමීමට තව තවත් ණය ලබා ගැනීමටද හැර වෙනත් විකල්පයක් ඉදිරිපත් කිරීමට තවම කිසිවෙකුත් ඉදිරිපත් වී නැත.

සැබෑ විකල්ප ප්‍රවේශයක් සෙවීම කළ හැකි වනු ඇත්තේ බොහෝ වෙහෙස මහන්සි වී ජනතාව සමග වැඩ කළ හැකි දිසුණු ජනතා ව්‍යාපාරයකට පමණකි. සංවිධානාත්මක ජනතාවගේ බලය කොරෙහි විශ්වාසයේ තබන පන්ති ව්‍යාපාරයකට පමණකි.

ලෝකය පුරා කැළඹීමක් ඇතිකළ ප්‍රංශයේ ශිෂ්‍ය ව්‍යාපාරය මෙතැනින් කොතැනටද?

ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාරය 2026 සැප්තැම්බර් 17-18 කාලයේදී ආරම්භ විය. එම විරෝධතාව ආරම්භ වූයේ පැරිස් අගනගරය ආසන්නයේම තෙටෙයිි උප නගරයේ පිහිටි Saint-E·upéry උසස් පාසලෙනි. ගුරු හිඟයට සහ සම්පත් හිඟකමට එරෙහිව පාසල් ගුරුවරුන් ආරම්භ කළ විරෝධතාවයට සිසුන් ද එක්වීමත් සමඟ එය රට පුරා වේගයෙන් ව්‍යාප්ත විය. ප්‍රංශ ශිෂ්‍ය ව්‍යාපාරයේ ප්‍රධාන සටන්පාඨ සියල්ලම පාහේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගැටලු සහ නව ලිබරල් කප්පාදු ප්‍රතිපත්ති ඉලක්ක කරගත් ඒවා වේ. "අයවැය කප්පාදුව, පරම්පරාවක බිලිදීමක්" (Budget cut - a generation sacrificed) තේමාව යටතේ ප්‍රංශ රජය අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් යුරෝ බිලියන 54ක අයවැය කප්පාදු කිරීමට එරෙහිව සිසුන් අරගල බිමට පිවිසියේය. "උසස් පෙළ පාසල් සඳහා වැඩි මුදලක්" (More money for high schools) ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීමක් විය. ගුරු හිඟය සහ පන්ති කාමරවල හදබද්ය සම්බන්ධයෙන් ප්‍රකට සටන්පාඨය වූයේ "සිසුන් 30 කට ගුරුවරුන් 0 යි, එක සිසුවෙකුට කැරලි මර්දන පොලිස් නිලධාරීන් 10 යි" (0 teachers for 30 students - 10 riot police for 1 student) යන තේමාවයි. ගුරු පුරප්පාඩු නොපිරවීම, අබලන් වූ පාසල් ගොඩනැගිලි හා යටිතල පහසුකම් පිළිසකර කිරීමට ප්‍රතිපාදන ඉල්ලා සිටීම, විශ්වවිද්‍යාල තේරීම් පද්ධතියට එරෙහි වීම, උසස් අධ්‍යාපනයට ඇතුළත් වීමේදී සිසුන් තෝරාගන්නා 'Parcoursup' නමැති අසාධාරණ යැයි සැලකෙන ඔන්ලයින් තේරීම් පද්ධතිය අහෝසි කිරීම හෝ සංශෝධනය කිරීම, වෙහෙසකර කාලසටහන් වෙනස් කිරීම වැනි සටන්පාඨ ගණනාවක් විරෝධතාවයට මුල් විය. පසුව මේවා අතරට පොලිස් මර්දනයට එරෙහි වීම පිළිබඳ සටන්පාඨයකුත් එකතු වූයේ විරෝධතාවල ගණන් බැලීමට ඔවුන් පෙළඹුණේ නැත.



ක්ෂණික කර්තව්‍යය වන්නේ කම්කරු - සිසු සමගිය සහ ඒකාබද්ධතාව නිර්මාණය කිරීමයි. ඒ අතර එම්මානුවෙල් මක්‍රෝන්ගේ අන්ත දක්ෂිණාංශික පාලනය පෙරලා දැමීම දක්වා මෙම අරගලය ඉදිරියට ගෙන යා යුතුය.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අනුව නගර 30 ක පමණ 256,000ක ජනතාවක් විරෝධතාවලට එක්වූ අතර, සංවිධායකයින් ගණනය කළේ එම සංඛ්‍යාව 450,000 ක් ලෙසයි. සංවිධායකයින්ට අනුව පැරිස් නුවර 100,000 ක්ද, මාර්සේයි සහ ටූලූස් නගරවල 30,000 බැගින් ද, ලිල් හි 25,000 ක්ද, ලියොන් හි 20,000 ක්ද විරෝධතාවලට එක්වූහ. මීට අමතරව නැන්ටස්, ස්ට්‍රාස්බර්ග්, මුල්හවුස්, ග්‍රෙනෝබල්, බෝඩෝ, රෙනෙස් ඇතුළු තවත් නගරවල මෙන්ම රේයූනියන් සහ මායොට් යන විදේශීය කලාපවලද තවත් තරුණ තරුණියෝ දහස් ගණනක් විදි බැස සිටියහ. ආණ්ඩුව පාසල් සහ විශ්ව විද්‍යාල වසා දැමීමේ මර්දන ක්‍රියාමාර්ග යක් ආරම්භ කළේය. ප්‍රංශ අධ්‍යාපන අමාත්‍යාංශයට අනුව, ප්‍රංශයේ පාසල් 891 ක පන්ති පැවැත්වීම සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් අත්හිටුවා ඇති අතර, ඉන් 250 ක්ම පැරිස් කලාපයේ පිහිටා ඇත. ප්‍රංශයේ ජාතික උසස් පාසල් ශිෂ්‍ය සංගමය සඳහන් කළේ සිසුන් විසින් වටලන ලද හෝ බලධාරීන් විසින් වසා දමන ලද උසස් පාසල් සංඛ්‍යාව 1,800 ක් පමණ වන බවයි. එමෙන්ම 'Sorbonne' සහ 'ENS Paris-Saclay' ඇතුළු විශ්වවිද්‍යාල පරිශ්‍ර 57 ක් වටලා ඇති බව ශිෂ්‍ය සංගමය (Union étudiante) ඔක්තෝබර් පළමු සතිය අවසානයේ නිවේදනය කළේය.

මේ ලිපිය ලියන මොහොත දක්වා බලධාරීන් විසින් 6,800 ට වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති අතර, ඉන් බහුතරයක් බාලවයස්කරුවන් වේ. එමෙන්ම 5,000 කට වැඩි පිරිසක් පොලිස් හාරයේ තබා ඇත. 'Lens' හි 'Auguste' Béhalz උසස් පාසල ඉදිරිපිටදී පොලිස් ග්‍රෙනේඩ් බෝම්බයක් එල්ල වීමෙන් 15 හැවිරිදි පිරිමි ළමයෙකුගේ අතක් අහිමි විය. 'Val-d'Oise' හි 14 හැවිරිදි දරුවෙකුගේ එක් ඇසක පෙනීම අහිමි වී ඇති අතර, එය රබර් උණ්ඩ ප්‍රහාරයකින් සිදුවූවක් බවට නීතිඥයෝ පවසති. අඟහරුවාදා, 'Metz'හි අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී බීම වැට සිටි පාසල් ශිෂ්‍යාවකට පොලිස් නිලධාරියෙකු විසින් ලිංගික අතවර කරන ආකාරය දැක්වෙන විඩියෝවක් නිසා රට පුරා මහජන කැළඹීමක් ඇතිවී තිබේ.

ප්‍රංශය තුළද නව ලිබරල් ධනවාදයේ කප්පාදු පිළිවෙත් එහි ඓතිහාසික අන්තයට පැමිණ ඇත. ලංකාවේ මෙන්ම ප්‍රංශයේද ජනතාව අතර දිළිඳු බවේ ප්‍රතිශතය වැඩි වෙමින් තිබේ. ඊට සාපේක්ෂව සමාජ ආරක්ෂණ සේවාවන් සියල්ල කප්පාදු කෙරෙමින් තිබේ. එහි ප්‍රධාන බිල්ල බවට පත්ව ඇත්තේ අධ්‍යාපනයයි. පාලක පන්තියට බලයේ රැඳී සිටීමට ඇති එකම මාර්ගය වන්නේ මර්දනකාරී ප්‍රතිපත්ති, ඒකාධිපතිවාදය සහ අන්ත දක්ෂිනාංශික මර්දනය බව ප්‍රංශයේ මෙන්ම ලංකාවේද උදාහරණ පෙන්වා දෙයි. 1968 ප්‍රංශ ශිෂ්‍ය අරගලය පොඩිපට්ටම් කර දැමීම සඳහා පාලකයන් කම්කරු ව්‍යාපාරයේ අවස්ථාවාදී නායකයන් භාවිතා කළේය. නමුත් මෙවර කම්කරු පන්තිය ශිෂ්‍ය ව්‍යාපාරය සමග අත්වැල් බැඳගෙන සිටී. ක්ෂණික කර්තව්‍යය වන්නේ කම්කරු - සිසු සමගිය සහ ඒකාබද්ධතාව නිර්මාණය කිරීමයි.

ඒ අතර එම්මානුවෙල් මක්‍රෝන්ගේ අන්ත දක්ෂිනාංශික පාලනය පෙරලා දැමීම දක්වා මෙම අරගලය ඉදිරියට ගෙන යා යුතුය. නමුත් එය ප්‍රමාණවත් නොවේ. වැඩකරන ජනතාවට එරෙහි මෙම ප්‍රහාරයට හේතුභූත වී ඇති නව ලිබරල් මූනුණුවරින් පෙනී සිටින ධනවාදී ක්‍රමය පෙරලා දැමීම අවසන්, කල් පවත්නා සහ ස්ථිරසාර විසඳුමයි. ලොව පුරම සමාජවාදී රාජ්‍යය වන පැරිස් කොම්යුනය පිහිටවූ ප්‍රංශ නිර්ධන පන්තිය එම ඉලක්කය කරා යාමට සමත් වේද? ප්‍රංශයේ ශිෂ්‍යයන් අරගලය ඇවිලවීමේ, ගිනිසිඹෙල් කාර්යභාරය ඉටු කර ඇත. දැන් අභියෝගය එය පන්ති අරගලයේ සංයුක්ත කොටසක් බවට පත් කිරීම සහ කම්කරු පන්තියේ නායකත්වය එයට සම්බන්ධ කිරීමයි.

දේශපාලන කාර්යය



මෙතැනින් පසු කොතැනටද?

බෙදීම් මැද විසි දෙක

සැප්තැම්බර් 24 වැනිදා පාර්ලිමේන්තුවේ පැවැත්වුණු ශත්දයෙන් ආණ්ඩුව 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජයග්‍රහණය කරන ලදී. ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ඇති නිසා එය පාර්ලිමේන්තුව තුළ ජයග්‍රහණය කිරීම පහසුය. නමුත් පාර්ලිමේන්තුව තුළ ලැබූ ජයග්‍රහණය එතැනින් පිට දේශපාලන පරාජයන් ගණනාවකට පාර කැපීමක් විය.

මීට පෙර මහින්ද රාජපක්ෂ පාලනය තමන්ට පාලනය කළ නොහැකි එවකට අගවිනිසුරුවරිය වූ ශිරානි බණ්ඩාරනායක ඉවත් කර, තමන්ට හිතවත් පුද්ගලයෙකු අගවිනිසුරු පුටුවේ වාඩි කිරීම සඳහා විශ්වාස භංගයක් ගෙන ආ අවස්ථාවේ එය පාර්ලිමේන්තුව තුළ ජයග්‍රහණය කිරීමට ඒ ආණ්ඩුව සමත් විය. නමුත් එවැනි ක්‍රියා නිසා ඇතිවූ ජනතා අප්‍රසාදය පසුව පුපුරා ගියේ මහින්ද රාජපක්ෂට පමණක් නොව සියලු රාජපක්ෂවරුන්ට දැවැන්ත පරාජයක් උරුම කර දෙමිනි. එනිසා මෙවැනි අවස්ථාවල ජය පරාජය පාර්ලිමේන්තු ශත්ද විමසීමේදී ප්‍රදර්ශනය නොවන අතර, එය තක්සේරු කළ හැක්කේ වසර ගණනාවකට පසුවය. ආණ්ඩුවේ මෙම 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට නීති ක්ෂේත්‍රයේ සියල්ලන් බරපතළ විරෝධයක් පෑවේය. විනිසුරුවරුන්ගේ සංගමය වන අධිකරණ සේවා සංගමය සහ නීතීඥවරුන්ගේ සංගමය වන ශ්‍රී ලංකා නීතීඥ සංගමය මෙයට විරුද්ධ වුයේ ඒකමතික තීරණයක් ලෙසිනි. එමෙන්ම සියලු ව්‍යාත්තිය සමිති ඇතුළු ප්‍රජා සංවිධාන එයට සංවිධානාත්මකව විරෝධය දැක්වීය. ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් පිළිබඳ උනන්දුවක් දක්වන සංවිධානවලද එබඳුම විරෝධයක් විය. ආණ්ඩුව මේ සියල්ලන් අමනාප කරගෙන සිය පාර්ලිමේන්තු බලය අත්තනෝමතික ලෙස භාවිතා කළ අතර මේ පිළිබඳ සමාජ විරෝධය ගිනි කන්දක් මෙන් ඇතුලතින් ඇවිලෙමින් ඇත.

ප්‍රශ්නය ගිනි කන්ද පුපුරා යන මොහොත ළඟද දුරද යන ප්‍රශ්නය පමණි. ජාතික ජන බලවේගය වටා එකතුවූ බලවේග තුළ මෙලෙස බෙදීම් ඇති වේද්දී එය බලවේගයට පමණක් සීමා නොවී, ජාතික ජනබලවේගයේ පාර්ලිමේන්තු කණ්ඩායම දක්වාම පැමිණ තිබිණි. මේ පිළිබඳව විමසන අවස්ථාවල බොහෝ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් පොද්ගලිකව පවසන්නේ තමන් මෙවැනි අත්තනෝමතික ක්‍රියාවකට එකඟ නැති බවය. බෙදීම ඊටත් වඩා ගැඹුරට ගොස් ඇති බව අනාවරණය වුයේ 22 වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පාර්ලිමේන්තු විවාදයේදීය. එම විවාදයේදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කතාවක් කළ සභානායක බිමල් රත්නායක අමාත්‍යවරයා පැවසුවේ ආණ්ඩුව තුළ පළමු බෙදීම සහ නොඑකඟතා මත ඉරිතැලීම් ඇතිවුයේ මෙම කරුණට අදාළව බවය.

එනිසා ආණ්ඩුව 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කොක්කෙන් හෝ කෙක්කෙන් සම්මත කර ගැනීමට තීරණය කළේ ඒ වෙනුවෙන් විශාල වන්දියක් ගෙවමින් බවය. ජාතික ජන බලවේගය තමන් වටා එකතුවූ බලවේග දුරස් කර ගත්තා පමණක් නොව, සිය සාමාජිකත්වය තුළද ඉරිතැලීමක් ඇති කරගෙන තිබේ. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කීර්ති නාමය පලුදු කරගෙන තිබේ. ප්‍රජාතන්ත්‍රවිරෝධී ලේඛලය තමන්ගේම පිටමත අලවාගෙන ඇත්තේ ආණ්ඩුවේම දායකත්වයෙනි. ආණ්ඩුව හා ජනාධිපතිවරයා එතරම් විශාල වන්දියක් ගෙවා, එතරම් තියුණු දේශපාලන අවදානමක් ගෙන මෙවැන්නක් කළේ නඩු ප්‍රමාදය වැළක්වීමට නොවන බව අමුතුවෙන් කිව යුතු නැත.

රාජ්‍ය ත්‍රස්ත පනත

ආණ්ඩුව 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා පමණක් නොව 22 අංකය තවත් පැත්තකින් සංකේතික එකක් විය. ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත වෙවත් පී. එස්. ටී. ඒ. නම් රාජ්‍ය ත්‍රස්තවාදය ව්‍යාප්ත කිරීමේ පනත් කෙටුම්පත ගැසට් කර පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද්දේ සැප්තැම්බර් 22 වැනිදාය. 2025 වසර අගදී මුලින්ම මෙකී පනත් කෙටුම්පත සමාජගත කරන ලද අතර එයට විශාල සමාජ විරෝධයක් එල්ල විය. ඉන් අනතුරුව ආණ්ඩුව කළේ එම කෙටුම්පත මහජන අදහස් සඳහා විවෘත කිරීමය. 2026 පෙබරවාරි 28 දක්වා මහජන අදහස් භාරගත් අතර දක්වන ලද බොහෝ අදහස් තුළ එම කෙටුම්පතේ මූලික පදනම් අභියෝගයට ලක් විය. ආණ්ඩුව මෙවර නැවත කෙටුම්පතක් පී. එස්. ටී. ඒ. නමින් ඉදිරිපත් කළේ මහජන අදහස් සැලකිල්ලට ගෙන වෙනස්කම්වලට බඳුන් කළ එකක් ලෙස කියමිනි. නමුත් ගැසට් කළ කෙටුම්පත මුල් කෙටුම්පතේ මූලික සහ ප්‍රධාන දේශපාලන මර්දනීය පදනම් සියල්ල අන්තර්ගත කරගෙන ඇත. ප්‍රධාන කරුණු එකඝටත් වෙනස් කර නැත. ඒවා වෙනස් කරන ලෙස ජනතාව දැක්වූ අදහස් හා යෝජනා සත පහකට පිළිගෙන නැත. මහජන අදහස් කැඳවීම ප්‍රෝඩාවක් වන අතර ජනතා අදහස් පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය, එහි ඇමතිවරයෙකුගේ භාෂාවෙන්ම කියන්නේ නම්, "දණහිස්සෙන් ඉහළට නොගැනීම"යි.

මේ පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් මුලින්ම කරන ලද්දේ ජෙරාල්ටාණි සම්මාජාවි සභාපතිවරයා විසිනි. පක්ෂය පැවසුවේ, මෙහි නම රාජ්‍යය ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීම වුණාට ඇත්ත අරමුණ රාජ්‍යය ජනතාවගේ දේශපාලන ක්‍රියාකාරීත්වයෙන් වසං කර ගැනීම බවයි. එමෙන්ම මෙහි අරමුණ ලෙස රාජ්‍යය ආරක්ෂා කර ගැනීම ලියා තිබුණාට සැඟවුණු අරමුණ ජනතා බලය දුර්වල කර රාජ්‍ය බලය වැඩි කර ගැනීම බවයි. මේ කෙටුම්පතේ වචනවල ත්‍රස්තවාදය පාලනය කිරීම ගැන ලියා තිබුණාට පසුපස තිබෙන්නේ මහජන දේශපාලන අවකාශය කප්පාදු කිරීමේ උවමනාව බවද පක්ෂය හෙළිදරව් කළේය. මෙහි ඉලක්කය ත්‍රස්තවාදීන් නොව ව්‍යාත්තිය සමිති නායකයන්, ගොවි නායකයන්, ශිෂ්‍ය නායකයන්, තරුණයන්, සමාජ ක්‍රියාකාරීන් හා ප්‍රජා නායකයන් මෙන්ම විකල්ප දේශපාලන මත දරන සංවිධාන බව පක්ෂය පැවසුවේ එහෙයිනි. ආණ්ඩුව ගමන් කිරීමට තෝරාගෙන ඇති මාර්ගය පැහැදිලි වන්නේ 22 වන සංශෝධනය, පී. එස්. ටී. ඒ. සහ ඕ. එස්. ඒ. ඇතුළු සියලු අණපනත් භාවිතා කරන ආකාරය සංයුක්තව බලන විටය. ආණ්ඩුව එම මාර්ගය තෝරා ගැනීමට හේතුවද පක්ෂය පැහැදිලි කර තිබිණි.

IMF කැරළි

පක්ෂයේ මාධ්‍ය හමුවේ කළ ප්‍රකාශය දිනපතා පුවත්පත් වාර්තා කර තිබුණේ මෙලෙසය. "ආණ්ඩුව සහ පොදුවේ පාලක පන්තිය මෙවැනි මර්දන නීති ගෙනෙන්නේ ඇයි? සමාජයේ තත්වය අන්තිම නරකයි. IMF ආඥා ශාන්තිකර දෙපාර්තමේන්තු ප්‍රධානී ක්‍රිෂ්ණා ශ්‍රීනිවාසන්ට අනුව මෙරට වයස අවුරුදු 15-24 අතර උගත් තරුණ විරැකියාව 43%ක්. එය ආසියාවේ වැඩිම අගය. ඉන්දියාවේ එය 41%ක්, නමුත් එහි තරුණයන් කැරලිපොතු ව්‍යාපාර හැදුවා. බංග්ලාදේශයේ 36%ක්, එහි තරුණයන් රජයේ රැකියා කෝටාවේ ප්‍රශ්නයට අරගල කරලා ජනාධිපතිනිය ගෙදර යැව්වා. මේ ගොල්ලෝ උගත් තරුණයන්ට බයේ මේ නීති ගේන්නේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව ජීවන වියදමට සාපේක්ෂවෙ වැටුපේ මූර්ත අගය සඳකද්දී ලෝකයේ රටවල් 130කින් ලංකාව 120 ස්ථානයේ. ඒ කියන්නේ ලංකාවට වඩා ජීවත්වීම අමාරු රටවල් 10යි ලෝකයේ තියෙන්නේ. දකුණු ආසියාවේ භූතානය හැර අනෙක් හැම රටක්ම ලංකාවට ඉහළින්. 2026 ලෝක සතුටු දර්ශකයේ ලංකාව ඉන්නේ රටවල් 147කින් 134 වන තැන. ලංකාවේ 62%ක් වැඩ බිමේදී ඉන්නේ අසතුටෙන්. දකුණු ආසියාවේ එම අගය 30%ක් පමණයි. ඒ කියන්නේ රැකියා තියෙන අයත් අසතුටෙන්, ජීවත් වෙන්න අමාරුයි. කම්කරුවෝ ඒකට විරුද්ධව පාරට එයි කියලා බයේ මේ නීති ගෙනෙන්නේ. ලෝක බැංකුවේ 2026 Sri Lanka Development Update වාර්තාවට අනුව ලංකාවේ ජනගහනයෙන් 65.4%ක් දරිද්‍රතා රේඛාවෙන් යට ඉන්නේ. ඒ කියන්නේ ජනගහනයෙන් තුනෙන් දෙකක්. ජනගහනයෙන් 33%ක් දරුණු ආහාර සුරක්ෂිතතා අර්බුදයක. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා නීති සම්මත කරන්න හදන්නේ පාර්ලිමේන්තුවෙන් එළියේ ඉන්න දුප්පත් තුනෙන් දෙක පාගන්න. මේක ඇතුළේ තුනෙන් දෙක හා එළියේ තුනෙන් දෙක අතර යුද්ධයක්. මේක පන්ති සටනක්."

ලංකාවේ සමාජය මෙතරම් විෂමතාවය වැඩි, ජීවත්වීම අසීරු අඩියට ඇද වැටුණේ IMF කප්පාදු පිළිවෙත් හේතුවෙනි. අප්‍රිකානු රටවල සහ ලතින් ඇමරිකානු රටවල මෙම කප්පාදු පිළිවෙත් ඔස්සේ යද්දී IMF කැරලි ලෙස නම්කර ඇති මහජන නැගිටීම් සිදුවිය. ආණ්ඩුව මේ මර්දනයේ දත් - නිය මුවහත් කරමින් සූදානම් වන්නේ ලංකාවේ ජනතාවගෙන් එන එවැනි ප්‍රතිචාරයකට සූදානම් වීමටය. එහි සැකයක් නැත. නමුත් 2027 මාර්තුවේ දැනට පවතින ළඟ වැඩසටහනේ කාලය අවසන් වේ. මෑතකදී බිමල් රත්නායක පැවසුවේ මාර්තුවේ ආණ්ඩුව IMF වැඩපිළිවෙළින් ඉවත් වන බවය. එම ප්‍රකාශය වංචාවකි. අමුතුවෙන් ඉවත් වීමට දෙයක් නැත. වැඩසටහන මාර්තුවේ අවසන් වේ. එසේනම් ආණ්ඩුව කියන්නේ ඉන් අනතුරුව තවත් වැඩසටහනකට නොයන බව විය යුතුය. නමුත් අපට වාර්තා වන ආකාරයට ආණ්ඩුව කිරීමට සැරසෙන්නේ IMF කප්පාදු පිළිවෙත් රටේ නීතිය බවට පත්කළ මහා බැංකු පනත, රාජ්‍ය ණය කළමනාකරණ පනත, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, ආර්ථික පරිවර්තන පනත ආදී ප්‍රතිගාමී නීති අහෝසි නොකර, එම වැඩසටහනේ යන අතර, IMF එකෙන් ණය මුදලක් ගෙන - ගිවිසුම් අත්සන් නොකර සිටීමටය.

ඒ ඇස්බැන්දුමට නොරුවටෙන ලෙස ජනතාව සූදානම් කිරීමේ වගකීමක් අපට ඇත. ඒ සඳහා රිතියා ආර්ථික ස්ථාවරත්වයේ පුරසාරම් වලට යටින් ඇති කුටුම්භ ආර්ථිකය බිඳ වැටීමේ යතාර්ථය කරළියට ගත යුතුය. ජනතාව මුහුණ දෙන ආර්ථික අර්බුදය දේශපාලනය සමග සම්බන්ධ කළ යුතුය. ජනතාව ආර්ථික අරගල පෙරමුණේ සහ දේශපාලන අරගල පෙරමුණේ සක්‍රිය කළ යුතුය. ඔක්තෝබර් 3 ජන අරගල ව්‍යාපාරය සමග පක්ෂයද එක්වන්නේ ජනතාව එම පෙරමුණු දෙකේ සක්‍රිය කිරීමේ අරමුණෙන් පමණක් නොව දෘෂ්ටිවාදී අරගලයේ වැඩකරන පන්තියට ජයග්‍රහණ අත්පත් කරදීම සඳහාය. එනම් මේ පන්ති සටනට අපේ පන්තියේ පැත්තෙන් බලඇණි ශක්තිමත් කිරීමයි. ආණ්ඩුව පාර්ලිමේන්තුව තුළ නව නීති හරහා සිය බලඇණි තර කරන විට ජනතාව දියවන්නාවෙන් එළියේ බලය සංවිධානය කළ යුතුය.

වසරේ මුල් මාස පහ තුළ රුපියල් කෝටි 1500ක රන් භාණ්ඩ උගසට

මේ සටහන් වෙන්නේ ලංකාවේ සාමාන්‍ය ජනයාගේ එදිනෙදා ජීවිතය ගෙවී යන ආකාරය ගැන එක්තරා ප්‍රකාශනයක්. මේ වගේ දේවල්වලින් ජන ජීවිතය ගැන ඇත්ත පින්තූරයක් අපිට හදාගන්න පුළුවන්. රන් භාණ්ඩ උගසට තියන්න වෙන්නේ අතේ සල්ලි නැති වුණාම. දරුවන්ගෙ අමතර අධ්‍යාපන වියදම්, ප්‍රවාහන වියදම් සෞඛ්‍ය ගැටලු, නිවාස ඉදිකිරීම් සඹහර උත්සව අවස්ථා වගේම ආහාර හා ඇඳුම් පැළඳුම් මේ වගේ ණය වෙන්න බලපාන කරුණු වෙනවා.

මහ බැංකුව කියන විදිහට මේ වසරේ පළමු මාස පහට අපේ රටේ ජනයා රුපියල් කෝටි 15,000ක් රන් භාණ්ඩ උගසට තියල. ඒ විතරක් නෙමේ රටේ සමස්ත රන් භාණ්ඩ උගස රුපියල් ට්‍රිලියනය ඉක්මවලා ඉවරයි. අපි ඒක තවත් සරලවම ගත්තොත් රුපියල් කෝටියේ ඒවා ලක්ෂයක් ඉක්මවලා රන් භාණ්ඩ උගස්කරලා තියෙනවා අපේ රටේ ජනතාව. මහ බැංකුවම කියන කාරණයක් තමයි මේ උගස් කරුවන්ගෙන් 70% කට උගස නැවත බේරා ගැනීමට බැරිවෙනවා කියලා.

මේ පින්තූරය එක පැත්තකට තියෙද්දි ලංකාව ඉහළ මැදි ආදායම්ලාභී රටක් හැටියට නම් කිරීමද අපූරු කරුණක්. මේ වර්ගීකරණය පවත්වගෙන යන්නේ ලෝක බැංකුව විසින්. රටේ වසරක සමස්ත ආදායම මුළු ජනගහනයෙන් බෙදුවාම එක් අයෙකුට හිමි ප්‍රමාණය අනුවයි මේක ගණනය කරන්නේ. ඒ අනුව යම් රටක ඒක පුද්ගල ආදායම ඩොලර් 4500 - 14000 අතර වෙනවා නම් එරට ඉහළ මැදි ආදායම් රටක් ලෙස නම් කරනවා. අපිට එක පාරටම ඇහෙන ප්‍රශ්නය තමයි අපේ රට කොහොමද එහෙම නම් කරන්නේ කියලා.



මේ පින්තූරය එක පැත්තකට තියෙද්දි ලංකාව ඉහළ මැදි ආදායම්ලාභී රටක් හැටියට නම් කිරීමද අපූරු කරුණක්. මේ වර්ගීකරණය පවත්වගෙන යන්නේ ලෝක බැංකුව විසින්. රටේ සමස්ත ආදායම මුළු ජනගහනයෙන් බෙදුවාම එක් අයෙකුට හිමි ප්‍රමාණය අනුවයි මේක ගණනය කරන්නේ. ඒ අනුව යම් රටක ඒක පුද්ගල ආදායම ඩොලර් 4500 - 14000 අතර වෙනවා නම් එරට ඉහළ මැදි ආදායම් රටක් ලෙස නම් කරනවා. අපිට එක පාරටම ඇහෙන ප්‍රශ්නය තමයි අපේ රට කොහොමද එහෙම නම් කරන්නේ කියලා.

මේක හරිම ව්‍යාජයක්. ලෝක බැංකුවේම තොරතුරු අනුව ගත්තත් අපේ රටේ ජනගහනයෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් අයත් වන්නේ දරිද්‍රතා රේඛාවෙන් පහළට. ඉහළ මැදි ආදායම් රටක මිලදී ගැනීමේ සාමාන්‍යය දිනකට ඩොලර් 8.3ක්. ඒ කියන්නේ රු.2724ක්, මෙහෙම දෙනික ආදායමක් අපේ ගොඩක් දෙනෙකුට නෑ. ඒක අපේ ජනගහනයෙන් 2/3ක්. ඒ කියන්නේ මුළු ජනගහනයෙන් 65.4 %ක්. ආර්ථිකය යථා තත්වයට පත් වූ බවට කියන කාරණාවලින් පීඩිත ජනයාගේ ආර්ථික ජීවිතයට සිදුවූ ඉටි ගෙඩියක් නැති බව මේ කරුණින් කියා දෙනවා. ඉතින් මැදි ආදායම් රටක් උනාට ජනගහනයෙන් 2/3 දෙකකට කිව්වු ප්‍රමාණයක් මිලදී ගැනීමේ හැකියාව ඔවුන් කියන රේඛාවෙන් පල්ලෙහා ඉන්නේ.

මෙහි ඇති අනෙක් ප්‍රධාන අනතුර වන්නේ අප මැදි ආදායම් රටක් බවට පත්වන විට අපට ගෙවීමට ඇති ණය කන්දරාව සඳහා පොලී අනුපාතවල ඉහළ දැම්මද සිදුවීමයි. මූල්‍ය අරමුදල හා ඇති එකඟතා අනුව අප මැදි ආදායම් රටක් බවට එනම් අපේ සමස්ත දළ දේශීය නිෂ්පාදනය වැඩිවන විට ඊට සමානුපාතිකව ජාත්‍යන්තර බැඳුම්කර ආදියට ඇති ණය පොලී වාරිකවල පොලී අනුපාතද ඉහළ දැමෙනවා. මේ තත්වය එක්තරා ආකාරයකට මූල්‍ය අරමුදල ලෝක බැංකුව ඇතුළු මූල්‍ය කොල්ලකාරිත්වයේ තවත් සැලසුමක් බව ඉතා පැහැදිලි කරුණක්.

අපේ රටේ ඇති නැති පරතරය කියන්නේ වත්මන් පාලනය තුළත් පෙර පැවැති පාලන චකවානුවලත් එකම ආකාරයකට වර්ධනය වූවක්. සටන් පාඨයක් හැටියට 'ප්‍රාග්ධන හිමියන්ට බදු ගසනු' යන්න කොරෝනා කාලේ පටන් ඇසුණත් එය ක්‍රියාවට නැගුණේ නෑ. සැබවින්ම වත්මන් පාලනය තුළත් වගේම පාලක පන්තිය ප්‍රාග්ධන හිමියන්ට ආරක්ෂාව සපයමින් පොදු මහත් ජනතාව මත මුළු බදු බර මුදාහැරුණා. ඔවුන් වාසනයේදී ප්‍රාග්ධනයේ ආරක්ෂකයන් වනවා. වත්මන් පාලනයත් ඊට කදිම නිදසුනක්. ඔවුන්ගේ ආර්ථික මෙහෙයවීම වාණිජ මණ්ඩල සභාපති හූලංගමුවලාට පැවරෙන්නේ ඒ අනුවය.

අපේ රටේ ජනගහනයේ ආහාර පරිභෝජනය බරපතළ විදිහට සීමා වෙන්නේ මේ අනුව වේල් තුනක පරිභෝජනය කරන්නට පුරුදු වූ ජනතාවක වේලක් අහිමි වීම එහෙම නැත්නම් දෙවේලක් අහිමිවීම සාමාන්‍ය දෙයක් බවට පත්වුණේ ඔය ආකාරයට. රටක කඩදාසි මත ආර්ථික සංවර්ධනය ගණන් බැලීම පොදු ජනයාගේ පිලෙන් බරපතළ ඛේදවාචකයක්.

රටේ සමස්ත ආදායම (GNI) ගණනයේ දී රජයේ බදු ආදායමීද එකතු වෙනවා. මේ බදු ආදායම පසුගිය වසරේ වාර්තාගත ලෙස ඉහළ ගියා. ආණ්ඩුව ඒ ගැන පුරාජේරු කතා නිරන්තරයෙන් මේ දවස්වල පළ කරනවා. ඒත් මේ බදු රජයේ ආදායමක් හැටියට ගනනය කළාට ඒවා ඍජු භාණ්ඩ නිෂ්පාදනයට ඇති සම්බන්ධයක් නෑ. එවැනි ප්‍රකාශනයක් මගින් ඇත්ත ආර්ථික ප්‍රසාරණයක් දැක ගැනීමට ලැබෙන්නේ නෑ. එහෙත් සමස්ත රටේ ආදායම් මට්ටම සංවර්ධනය ගැන තත්වයක් හැටියට මේ GNI එක ගණන් ගැනෙනවා. එහි ඇති බරපතළම කාරණය තමයි මේ බදු භාණ්ඩ හා සේවා මත ඉතා බරපතළ ලෙස පතිත වීම. දැනටමත් මේ වසරේ ජනවාරි ජූනි අතර කාලයේ රජයේ බදු ආදායම රුපියල් බිලියන 2710.0 ක්. 2025 වසරේ රටේ සමස්ත බදු ආදායම රුපියල් බිලියන 5050ක්. නැතිනම් ට්‍රිලියන 5.05ක්. අනෙක් අතට මේ වෙද්දී එක් පවුලක් එක් මාසයක් සඳහා ආසන්න වශයෙන් භාණ්ඩ හා සේවා මත බදු රුපියල් 41,146ක් ගෙවමින් සිටිනවා. ඉන් පැහැදිලිම කියා දෙන්නේ බදු බර එක එල්ලේ මෙරට පොදු ජනයාගේ කර මත තවදුරටත් පැටවී ඇතිවා මෙන්ම එය තීරණාත්මක ලෙස ජන ජීවිතයට බලපා ඇති බවයි.

මේ ආර්ථික ක්‍රියාවලිය තවදුරටත් බල පවත්වන සහ ඉතා ප්‍රචණ්ඩ ලෙස පොදු මහත් ජනතාව වෙත කඩා වැටීමට නියමිතයි. එහි නිශ්චිත ප්‍රකාශනයක් වන්නේ, ඊ. පී. එෆ්. අරමුදල වැනි ලක්ෂ සංඛ්‍යාත වැඩ කරන ජනයාගේ අයිතිවාසිකම් වූ අරමුදලක් කොල්ලකෑමට වත්මන් පාලනයද මුල පිරීමයි. හූලංග මුවලාගේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කල්පනාව අනුව එවැනි අරමුදලක් රාජ්‍ය වගකීම යටතේ පැවතීම අපරාධයකි. ඒවා පොදු අරමුදල් මහජන අරමුදල් හැටියට නොව මූල්‍ය සංසරණය සඳහා මුදා හැරිය යුතුය. එවිට ඒවායේ ආරක්ෂණය වගකීම මුළුමනින්ම රාජ්‍යයෙන් වැඩ කරන ජනයාගෙන් බැහැරවනු ඇත.

නව ආයෝජන පනත, තනි කම්කරු නීතිය වැනි පනත් හරහාද උත්සාහ දරනුයේ ප්‍රාග්ධන ප්‍රසාරණය හරහා ධනේශ්වර සංවර්ධනය අත්පත් කර ගැනීම නැවැත්ති ක්‍රියාවලියට මුල් පිරීමය. නව තුස්න පනත ගෙන එන්නේද ඒ සඳහා ඒ මගෙහිම ප්‍රාග්ධන ආරක්ෂාව වෙනුවෙනි.

එවිට ප්‍රාග්ධනයට ආරක්ෂාවත් කම්කරු ජනයාට පොදු ජනයාට අනාරක්ෂාවත් නිර්මාණය වීම පොදු තත්වයකි. ලෝකයේ මැදි ආදායම් රටක් හැටියට බැබලෙන විට මෙරට කම්කරුක ගොවි ජනතාව තවදුරටත් කබලින් ලිපට වැටුණු ඇත.

‘22: JRගෙ පඩංගුවට තවත් අණ්ඩයක්’ යන තේමාවෙන් 22වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් පැවැත් වූ සම්මන්ත්‍රණයේදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් චමීර කොස්වත්ත සහෝදරයා විසින් පළ කළ අදහස්වල සම්පිණ්ඩනයක් පහත පළ වේ.



අරමුණ කොච්චර හොඳ වුණත්, යන්නේ වැරදි ක්‍රියාමාර්ග තුළින් නම්, හොඳ අරමුණ මකබැව්ලා යනවා.

- චමීර කොස්වත්ත සහෝදරයා

අපේ පැරණි ජනප්‍රවාදයේ එන ‘තල වපුරලා අස්වැන්නට මුං නෙලන්න බෑ’ යන කියමනෙන් සමාජයට නිළිණ කරන්නේ අතිශය පදනම් සහගත දේශපාලන සහ සංකල්පීය සත්‍යයකි. යම් පාලන ක්‍රමයක් හෝ ආණ්ඩුවක් ක්‍රියාත්මක වන යථාර්ථවාදී, ව්‍යුහගත පදනම මත මිස, පාලකයන් විසින් ප්‍රචාරක වේදිකාවලදී කියනු ලබන උපදේශ, සිහින හෝ ජනප්‍රිය සටන් පාඨ මත ජනතාවට යහපත් ප්‍රතිඵල බලාපොරොත්තු විය නොහැක.

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ව්‍යවස්ථානුකූලවාදයේ එක් මූලික පදනමක් වන්නේ රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා තනි තනිව සෑම පුද්ගලයෙකුටම මෙන්ම සෑම සුළුතර ප්‍රජාවකටම සමාන ලෙස පැවතීමට, වර්ධනය වීමට සහ ජීවත් වීමට අවශ්‍ය නෛතික සහ සමාජීය පදනම නිර්මාණය කිරීමයි. එහෙත්, කාන්තාවන් වීම නිසාම ඔවුන්ගේ අත්‍යවශ්‍ය ශාරීරික වුවමනාවක් වන සනීපාරක්ෂක ද්‍රව්‍ය සඳහා පවා අසීමිත ලෙස බදු ගහන, එසේ අසීමිත ලෙස බදු ගැසීමට නිහඬතාවයෙන් අනුමැතිය දෙන සමාජයක පවතින ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාවක් කුමක්දැයි යන්න අප අතිශය බරපතළ ලෙස ප්‍රශ්න කළ යුතුය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාව ඇතුළේ මෙවැනි ප්‍රශ්න කිරීමක් තරමක් අමුතු එකක් ලෙස පෙනෙන්නට පුළුවන. එහෙත්, ආර්ථික පීඩනය, සමාජීය පැවැත්ම සහ ප්‍රජාතන්ත්‍රවාදයේ සාක්ෂරතාව යනු එකිනෙකින් වෙන් කර විමසිය හැකි කාරණා නොවේ. අපගේ සමාජයට අද තියෙන්නේ අපේ සමාජයේ අයිතිවාසිකම් පිළිබඳව, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව සහ ඕට වඩා යහපත් සමාජයක් දිනා ගැනීම පිළිබඳව පවතින සමාජ සාක්ෂරතාව නැතහොත් ‘නන්දි සවිඥානිකත්වය’ ඉහළ නැංවීමේ බරපතල අභියෝගය සහ සමාජීය වගකීමයි.

ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අරගලය

වැඩවසම් අත්තනෝමතිකත්වයට සහ රාජාණ්ඩුවලට එරෙහිව ලෝක ඉතිහාසයේ නිර්මාණය වූ දීර්ඝ අරගලයන් මගින් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම දමන ලදී. රජු යනු දෙවියන්ගේ කැමැත්ත බවත්, ඔහුගේ අභිමතය නීතිය බවත් සිතූ වැඩවසම් අත්තනෝමතිකත්වයෙන් සමාජය ඉදිරියට පැමිණියේ ධනවාදයේ නැගීමත් සමගය. රජුගේ බලය වෙනුවට සමූහ ආණ්ඩු ගොඩනැගීමේ මෙම සටන එක රැයකින් සිදු වූවක් නොවන අතර, ප්‍රංශ විප්ලවය වැනි සියවසක අරගලයන්ගේ අවසානයේදී සමූහ ආණ්ඩු ලෝකය තුළ තහවුරු විය. එහිදී ලිබරල් සාකච්ඡාව විසින් රාජාය නැතහොත් ජනතාවගේ බලය යනු ජනතාව තමන්ගේ සම්මුතියකින් පවරන්නාවූ සහ ගොඩනගන්නාවූ දෙයක් ලෙස අර්ථකථනය කෙරිණි. එනම්, ජනතාව තමන්ගේ සම්මුතියකින් පාලනයට බලය පවරයි. මෙම සමාජ සම්මුති සාකච්ඡාවේදී තෝමස් හෝබ්ස්ව කරේ තබාගෙන යන බොහෝ දෙනා ඒත් ජැක් රූසෝව අමතක කරති නැතහොත් මග හරිති. රූසෝ සමාජ සම්මුති න්‍යායට තව අත්‍යවශ්‍ය සංඝටක දෙකක් එකතු කළේය.

පළමුවැන්න නම්, ජනතාව විසින් සාදාගත් සම්මුතිය පාලකයන් විසින් බිඳ දමන්නේ නම්, ජනතාවට නැවත එම පාලනය ප්‍රශ්න කිරීමට සහ තමන් නිර්මාණය කළ පාලනය පෙරළා දැමීමට අයිතියක් ඇති බවයි. දෙවැන්න නම්, සමාජ සම්මුතිය විසින් නිර්මාණය කරන්නේ ජනතාවට වඩා යහපත් ජීවිතයක් උදා කර දීමේ වගකීම පවරන්නාවූ රාජ්‍යයක් බව පවසමින් ආර්ථිකයේ පදනම ඊට සම්බන්ධ කිරීමයි. එසේම, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය යන ප්‍රධාන සංඝටක තුන එකිනෙකින් සාපේක්ෂ ස්වාධීනත්වයකින් පවත්වා ගනිමින්, එකකින් අනෙකට අත්තනෝමතික ලෙස බලපෑම් සිදු නොවන ආකාරයට පවත්වා ගැනීමට මොන්ටෙස්ක්‍යූගේ බල සමතුලිත න්‍යාය (Check and Balance) පැමිණියේය. විධායකය තුළ පවා බලය අත්තනෝමතික ලෙස ඒකරාශී වීම ප්‍රජාතන්ත්‍රවාදය නොවන බව ලෝකය පිළිගත් පදනම විය.

මේ ආකාරයෙන් සමාජ සංවිධානයේ යම් නියැලිත සන්ධිස්ථානයක් සනිටුහන් කළ ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාවට 2022 අරගලය මගින් අලුත් දේශපාලන සන්ධිස්ථානයක් එකතු විය. බිඳවැටුණු ආර්ථිකය මත පදනම්ව නිර්මාණය වූ එම 2022 අරගලය තුළ පවා පුළුල් ලෙස සමාජ කතිකාවට බඳුන් වූයේ ඔහු ආර්ථිකමය ප්‍රකාශනයක් පමණක් නොවේ. ඒ ප්‍රකාශනය ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, අයිතිවාසිකම් පිළිබඳ, බහුතරයක් නොවන ජන කොටස්වල ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රශ්න පිළිබඳව, කාන්තා විමුක්තිය පිළිබඳව සහ වෙනස් පුද්ගලභාවයන් සහිත සියලු දෙනාගේ අයිතිවාසිකම් පිළිබඳව බරපතල සාකච්ඡාවක් සමාජයට රැගෙන ආවේය. දුර්වල, ඊනියා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය අභිබවමින් ජනසභාගී නැතහොත් ජනතාව බලගන්වන්නාවූ ප්‍රජාතන්ත්‍රවාදයක් පිළිබඳ අවශ්‍යතාවය කරළියට ආවේය. එක පැත්තකින් ආර්ථික අර්බුදය විසඳුම් දෙන බවට වූ පොරොන්දුව සහ අනෙක් පැත්තෙන් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මෙම අවශ්‍යතාව මත ජාතික ජන බලවේගය (NPP) වටා පුළුල් සමාජ පෙරමුණක් ගොඩනැගුණු අතර, ප්‍රජාතන්ත්‍රවාදයේ අවකාශයේ සිටී බොහෝ දෙනා අඩු වැඩි වශයෙන් ඔවුන්ව බලයට ගෙන ඒමේ ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් වූහ. එහෙත්, බලයට පත්වීමෙන් පසු අධිකරණයේ බලය ඇල්ලීම යටත් විජිත බලයේ අවසන් බලකොටුව බිඳ දැමීමක් ලෙස හඳුන්වමින් ආණ්ඩුව පැත්ත අරගෙන කතා කළ ප්‍රකට මහාචාර්යවරයාගේ ප්‍රකාශ වැනි දේ හුදෙක් ඛේදනීය කියමන් බවට පත් වී ඇත. අතීතයේ මර්දනයන්ට එරෙහිව, රාජපක්ෂලාගේ සුදු වැන් හා අනිතික හමුදාවන්ට එරෙහිව සටන් කළ සියලු දෙනාට අද සිදුව ඇත්තේ 22 වැනි සංශෝධනයේ කැඩපතින් නැවත තමන් දෙස බලන්නටය. 22 කැඩපතින් බලන විට පෙනී යන්නේ, තමන් එදා සටන් කළ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් අද ඔවුන් විසින්ම පාවාදී ඇති බවයි.

ප්‍රජාතන්ත්‍රවාදය, අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ සාකච්ඡාව ලෝක ඉතිහාසයේ ‘පුනරුදය’ ලෙස මතු වුවද, පන්ති ආධිපත්‍යය අත්පත් කරගත් ධනපති පන්තිය විසින් එම අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාව සමාජය ඇතුළේ තිබුණු පන්තිමය විමතාවන්ගේ කැකකුණු වසාගැනීමේ කඩතුරාවක් බවට පත් කරගත්තේය. පීඩනය සහ සූරාකෑම පවතින අතරතුර, තමන්ව සූරාකන සහ මර්දනය කරන පාලකයා කවුදැයි තෝරාගැනීමට කාලෙකට වතාවක් සර්වජන ඡන්ද බලය හරහා ජනතාවට නිදහස දීම අසම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයකි.

අපේ වගේ සමාජවල අහිමි වී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඒ ශක්තිමත් කියවීමයි. පුද්ගලවාදය, තනි පුද්ගල නායකත්වය සහ පුද්ගලයන් මත රඳා පැවැත්ම ප්‍රතික්ෂේප කරමින්, පොදු සමාජයිය සාමූහිකත්වය සහ පුද්ගලයන්ගේ කැමැත්තට උඩින් නීතියේ ව්‍යවස්ථානුකූලභාවය ස්ථාපිත කිරීම පුනරුදයේ අර්ථය වුවද, තමන්ගේ ප්‍රචාරක ව්‍යාපාරයට ‘පුනරුදය’ කියා හාවිත කළ ජාතික ජන බලවේග ආණ්ඩුව ඇතුළේ සිටින කිහිපදෙනෙකුවත් එහි සැබෑ අර්ථය දන්නවාදැයි සැක සහිතය. ලංකාවේ නීති සහ ව්‍යවස්ථා ඉතිහාසය දෙස බැලූ විට, 1948 සෝල්බරි ව්‍යවස්ථාවෙන් පසුව, 1972 දී ගෙන ආ පළමු ජනරජ ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේදී පවා ගොවියන්ගේ, ධීවරයන්ගේ හෝ කම්කරුවන්ගේ ප්‍රශ්න ජනතාව අතර නැවත සංවාදයට බඳුන් කළේ නැත. 1978 ව්‍යවස්ථාවේ පැවැති සති දෙක්ක කාලය වැනි අංශුමාත්‍රික ජනසභාගීත්වයක්වත් එදා ජනරජ ව්‍යවස්ථාවේ තිබුණේ නැති අතර ගැටුම තිබුණේ නිලධාරීන් සහ රාජ්‍ය තන්ත්‍රය අතර පමණි.

පේ.ආර්. සහ අධිකරණය

1978 දී ජේ. ආර්. ජයවර්ධන විසින් තමන්ට තිබූ 5/6ක බලය පාර්ලිමේන්තුවට ගෙනැවිත් සම්මත කළ අර්ධ ජනාධිපති ව්‍යවස්ථාව යනු එක්සත් ජනපද ව්‍යවස්ථාවටත් වඩා අන්තිම ප්‍රජාතන්ත්‍ර විරෝධී ව්‍යවස්ථාවකි. එක්සත් ජනපද ව්‍යවස්ථාව ඇතුළේ කොංග්‍රසයෙන් ජනාධිපතිවරයාව වෙන් කර ඇති අතර ජනාධිපතිට කොංග්‍රසයට ඇඟිලි ගැසිය නොහැක. එහෙත් අපේ ජනාධිපතිට පාර්ලිමේන්තුවට යාමට, ව්‍යවස්ථාදායකයට වගකියන මුදල් පිළිබඳ අමාත්‍යධුරය දැරීමට සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පවා බලය ඇත. 17, 18, 19 සහ 20 වැනි සංශෝධන හරහා වෙනස් වෙමින් ආ මෙම 78 ව්‍යවස්ථාව කරපින්නගෙන යන අතරතුර, ‘හොඳ අයගේ අත්වල විධායක ජනාධිපති ධූරය තියෙනවා නම් ඒක ප්‍රශ්නයක් නෑ’ කියා පැවසීම මොන තරම් මුග්ධ ප්‍රකාශයක්ද? මානව ඉතිහාසය පුරා රාජාණ්ඩු සිට සමූහාණ්ඩු දක්වා ගිය ගමන පුද්ගලයන් මත නොව, ක්‍රමය සහ පුද්ගලයාට ඉහළින් තිබෙන එකඟතාව හා සම්මුතිය මතය. ජේ. ආර්. ජයවර්ධනට මෙතරම් අත්තනෝමතික බලයක් සහිත ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමට සිදු වූයේ ඔහු ආර්ථිකය ඇතුළේ කරගෙන ආ නව-ලිබරල් වෙනස්කම් නිසාය. සිංගප්පූරුව, දකුණු කොරියාව වැනි රටවල මෙන්ම රාජ්‍යයේ බලහත්කාරය මත පදනම් වී නව-ලිබරල් ප්‍රතිසංස්කරණ කිරීම සඳහා ධනපති පන්තියට මෙවැනි ඒකාධිපති ව්‍යවස්ථාවක් අවශ්‍ය විය. 1975 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක පළමුවෙන්ම ව්‍යූහාත්මක වෙනස්කම් ගැන කී අතර, 1994 පොදුජෙරමුණ ආණ්ඩුවද නව-ලිබරල් වැඩපිළිවෙළම තෝරාගත්තේය.

මෙම පන්තිමය උවමනාව ඇතුළෙන්ම එක කණ්ඩායමක හෝ පක්ෂයේ බලය පවත්වා ගැනීමේ උවමනාවද සම්බන්ධ වේ. නව-ලිබරල් ප්‍රතිසංස්කරණ කරද්දී අත්තනෝමතික බලයක් අවශ්‍ය වන නමුත්, තනි මිනිසෙකු හෝ පක්ෂයක් පමණක් ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරගෙන යන විට පද්ධතිය අවුල් වී කාර්මික සාමය බිඳවැටේ. එවිට ධනපති ක්‍රමයට ජේ. ආර්. ජයවර්ධනලාව පවා අතහැරීමට සිදු වේ. ජේ. ආර්. ජයවර්ධන විසින් 1977 දී සාමාන්‍ය නීතිඥයෙකු ලෙස සිටි තමන්ගේ මිතු නෙවිල් සමරකෝන්ව අග්‍රවිනිශ්චයකාර ගුණවර්ධනගේ සහ රත්නසිරි වික්‍රමනායකගේ නඩුවලදී ඔහු ආණ්ඩුවට එරෙහිව මානව හිමිකම් හිනිඳු දිහ නිසා 1984 දී ලලිත් ඇතුළත්මුදලිගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් දමා නෙවිල් සමරකෝන්ට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන එන ලදී. 1994 දී චන්ද්‍රිකා කුමාරතුංග ආවෙන් විධායක ජනාධිපති ධූරය අහෝසි කරන බව කියමිනි. එහෙත් ඇයටද තුස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත වැනි නව නීති පෝලිමට අරගෙන ඇවිත් ඇත. කර්මාන්තශාලාවක තමන්ගේ ෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන කම්කරුවාට ඇප නොලැබෙන පරිදි නීති හදමින්, කම්කරු සේවය අහෝසි කිරීමේ නීති හාම්පුතුන්ට වාසිදායක ලෙස වෙනස් කරමින් ඉදිරියට යාමට ආණ්ඩුව කටයුතු කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ප්‍රමුඛ ව්‍යාපාරික ජාල එකතු කරගන්නා විටම ආර්ථිකය ගැන මොවුන්ට මහ ලොකු උත්තරයක් නැති බවට සැකයක් තිබුණද, අවම වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය කලාපයේවත් සාධනීය වෙනසක් කරනු ඇතැයි බොහෝ දෙනා බලාපොරොත්තු වූහ. මලෙයෙහ තමිල් ජනතාවගේ සිවිල් අයිතිවාසිකම්, උතුරේ ඉඩම් හා අතුරුදන්වූවන්ගේ ප්‍රශ්න, PTA අහෝසි කිරීම හෝ පරණ රෝම ලන්දේසි නීති, ළමා හා කාන්තා නීති වෙනස් කිරීම වැනි කිසිදු ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධනයකට ආණ්ඩුව අත තබා නැත. ඒ වෙනුවට 78 ව්‍යවස්ථා සඩංගුවට ඔවුන් දාන අණ්ඩ වන්නේද ධූර කාලය දික් කිරීමයි. මකරා මරන්න ගිය වීරයාට මකරාගේ නියපොතු පාර වැදී අවසානයේ වීරයා මකරකු බවට පත්වන ‘මකරාක්ෂ’ නාට්‍යයේ මෙන්, ප්‍රජාතන්ත්‍රවාදය ගැන ටියුෂන් දුන් අය අද ඒකාධිපති ව්‍යවස්ථා පඩංගු රැකගන්නා තත්ත්වයට පත්වීම බේදනීය සරදමකි.

ජනතා ව්‍යවස්ථාවක් වෙනුවෙන් අරගලය

අඛණ්ඩව උද්ධමනය වැඩිවෙමින්, ජනගහනයෙන් තුනෙන් එකක් දෛනික ආහාර වේල සපයා ගැනීමට අපහසුව සිටින විට, රාජ්‍ය අංශයේ කම්කරුවාගේ තථ්‍ය ආදායම 18%කින් අවප්‍රමාණ වී දරුවන්ගේ අධ්‍යාපනය හා බෙහෙත් ටික කපා හරින්නට සිදුව ඇති මොහොතක, අනුර දිසානායක ජනාධිපතිවරයාට කොත්තමල්ලි බොන්නට යෝජනා කිරීමට සිදුව තිබේ. මෙය හුදු ආර්ථික ප්‍රශ්නයක් නොව ජීවත් වීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පිළිබඳ ප්‍රශ්නයකි. අතීතයේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය මගින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පමණක් ගණනය කළ අතර කොමියුනිස්ට් පද්ධති මගින් ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් දීමට උත්සාහ කළද, 1993 වියානා සම්මුතියෙන් සහ 1996 දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාවෙන් පසුව, මෙම දෙවර්ගයේම අයිතිවාසිකම් යනු වෙන් කළ නොහැකි විශ්වීය මානව හිමිකම් ලෙස පිළිගෙන ඇත. එසේම, ජෛවමිතික දත්ත ඉන්දියාවට අයිති වන රහසිගත ගිවිසුම් ගණ ඒ ගැන ඇසූ විට ‘ඉන්දියාවෙන් අහලා කියන්නම්’ කියන කැබිනට් ප්‍රකාශකයන් සිටින රටක ප්‍රජාතන්ත්‍රවාදයේ මට්ටම කුමක්ද? ලෙනින් බ්‍රෙස්ට්-ලිටොව්ස්ක් ගිවිසුම ගැසුවේද හතරවෙනි සෝවියට් නියෝජිත සම්මුඛව කැඳවා ජනතාව සමග සාකච්ඡා කර නිර්ධන පන්ති රාජ්‍යය ආරක්ෂා කිරීමටය. රාජ්‍ය බලය උපදින්නේ දේපල සමග වන අතර දේපල හිමි පන්තිය විසින් තමන්ගේ නීති ආධිපත්‍යය සහ දෘෂ්ටිවාද ආරක්ෂා කර ගැනීමට සාදාගත් සැකැස්ම රාජ්‍යයයි. එබැවින්, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නය ආර්ථිකයෙන් ගලවා තනිව සාකච්ඡා කළ නොහැකි අතර, කාලෙකට වතාවක් තමන්ව මර්දනය කරන්නේ කවුදැයි තෝරාගැනීමට ලැබෙන ඡන්ද බලයට පමණක් සීමා නොවී, පන්ති සවිඥානිකත්වය තුළින් සැබෑ සමාජ හා ආර්ථික අයිතිවාසිකම් දිනාගැනීම උදෙසා මුළු සමාජයම පෙළගැසිය යුතුය.

මීට අමතරව, හොරු ඇල්ලීමේ සටන් පාඨය ඉදිරියට දමමින් මහජන අවධානය වෙනතකට යොමු කිරීමට ආණ්ඩුව උත්සාහ කළද. සැබෑ ලෙසම දූෂණය තුරන් කිරීම සඳහා අවශ්‍ය කරන නෛතික හා ව්‍යුහාත්මක සංශෝධන සිදු කිරීමට ආණ්ඩුව අසමත් වී ඇත. උපයාගත් ආකාරය හෙළිදරව් කිරීමට නොහැකි තනි රීති සම්පාදනය කිරීමට හෝ අපනයන ආදායම් සහ ණයවර ලිපි හරහා විදේශයන්හි රැඳවෙන ඩොලර් සංචිත යළි රට තුළට ගෙන ඒම තහවුරු කෙරෙන විධිමත් පනත් ගෙන ඒමට ආණ්ඩුව කටයුතු කර නැත. ඒ වෙනුවට සිදුවන්නේ අතීතයේ දූෂණ හා වංචාවලට වෝදනා ලැබූ, පැරණි පාලනයන්ගේ සේවය කළ නිලධාරීන්ම නැවත තනතුරුවලට පත් කරගනිමින් ව්‍යාජ රංගනයක නිරත වීමයි. දේශපාලන තන්ත්‍රය, නිලධාරී තන්ත්‍රය සහ ජාවාරම්කාර ව්‍යාපාරික ප්‍රජාව එකතු වී නිර්මාණය කර ඇති මෙම මර්ද පද්ධතිය වෙනස් නොකර, නව-ලිබරල් වැඩපිළිවෙලම තවදුරටත් ක්‍රියාත්මක කරමින් සිදු කරන හොරු ඇල්ලීමේ ප්‍රචාරයන්ගෙන් සැබෑ සමාජීය හෝ ආර්ථික පරිවර්තනයක් සිදු විය නොහැක.

ජනතාවගේ පරමාධිපත්‍ය බලය සැබෑ ලෙසම තහවුරු වන ජනතා ව්‍යවස්ථාවක් දිනා ගැනීමේ අරගලය වර්තමාන සමාජය හමුවේ ඇති ප්‍රධානතම දේශපාලන වගකීම වේ. එවැනි සැබෑ ජනතා ව්‍යවස්ථාවක් ඇතුළේ විධායක ජනාධිපති, අගමැති හෝ කැබිනට් මණ්ඩලය ඇතුළු කිසිදු නායකත්වයකට අත්තනෝමතික ලෙස කටයුතු කිරීමට ඉඩ නොලැබෙන අතර, විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය සහ නිලධාරී තන්ත්‍රය යන සියලු ආයතනයන් මහජන බලය හමුවේ සෘජුවම සංවරණයට සහ තුලනයට (Check and Balance) ලක් විය යුතුය. මහජන නියෝජිතයන් පත් කිරීමට මෙන්ම ඔවුන් මහජන අභිලාෂයන් පාවා දෙන විට නැවත කැඳවීමේ බලයද ජනතාව සතු විය යුතුය. ජාතික ප්‍රශ්නයට සාධාරණ විසඳුම් ලබා දෙමින්, සියලු සුළුතර ප්‍රජාවන්ගේ සහ සෑම තනි පුද්ගලයෙකුගේම මානව හා සිවිල් අයිතිවාසිකම් සුරක්ෂිත කෙරෙන, පන්ති සවිඥානිකත්වයෙන් යුත් සැබෑ ජනතා පාලනයක් උදෙසා පෙළ ගැසීම හැර අන් කිසිදු විකල්පයක් ලාංකීය සමාජයට ඉතිරි වී නොමැත.

ප්‍රජානෝ විඳියම

“ආණ්ඩුව නීරණය කරලා දරුවෙක්ව මහණ කෙරුවොත් ඒ දරුවාගේ දෙමව්පියන්ට නිවසක් හදලා දෙන්න..”

ආණ්ඩුව නැවත වතාවක් ඔප්පු කරලා තියෙනවා තමන් අවශ්‍ය නම් රාජපක්ෂ වාදයටම පල්ලම බහින්න වුණත් සූදානම් කියලා.

හය හතර නොතේරෙන දරුවෝ මහණ කළාම ඔවුන් කායික හා මානසික අපයෝජනයන්ට ලක්වන බව රට පුරා සිදුවන සිදුවීම්වලින් යළි යළිත් ඔප්පු කරමින් තියෙන වෙලාවක තමයි ආණ්ඩුව මේ අඳහන නීරණය අරන් තියෙන්නේ..

සම්ප්‍රදායික විපක්ෂය මෙය විවේචනය කරන්නේ දරුවන්ට සිදුවන අපයෝජනයන්ගේ පැත්තෙන් නෙමෙයි. ඔවුන් අහන්නේ ‘දරුවාව මහණ කරලා, ආණ්ඩුවෙන් දෙන ගේත් අරගෙන දරුවා සිවුරු හැර ගියොත් දීපු ගේ නැවත ගන්නවද?’ කියලයි.

මාක්ස් පැවසුවේ ‘ආගම යනු දුප්පත් ජනයා සඳහා මායාකාර මනකල්පිත නිර්මාණය කිරීමක්’ කියලා. ජීවිතයේ සැබෑ සන්තෘෂ්ටිය සොයා ගැනීමෙන් මිනිසා වළක්වනුයේ ආගම බවත් මාක්ස් පැවසුවා. මොකද ආගම පවසන්නේ මිනිසාට එය ලබාගත හැක්කේ ඊළඟ ආත්මයේදී බවයි. එනිසාමයි මාක්ස් කියේ ‘ආගම යනු පීඩිත බවට පත්වුණු සත්වයාගේ සුසුම කියලා. පිරිසිදු ආත්මයන්ගෙන් තොර ලොවක ආත්මය කියලා. හදවතක් නැති ලෝකයක හදවත’ කියලා.

මාක්ස් නිර්වචනවම ස්වර්ගයේ සිට පොළොවට බසින මාර්ගය වෙනුවට පොළොවේ සිට ස්වර්ගය දෙස බලන මාර්ගය තමන් තෝරා ගත් බව සනිටුහන් කළා. එනම් විඥානය විසින් ජීවිතය නොව ජීවිතය විසින් විඥානය නිර්මාණය කිරීම පිළිබඳව ඔහු අඛණ්ඩව අවධාරණය කළා.

‘ආගම යනු කුමක්ද?’ කියලා මීට දශක දෙකෙකට පෙර කරපු අධ්‍යාපන කථාව තවදුරටත් ජනතා විමුක්ති පෙරමුණට කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය අපිට අහන්න වෙන්නේ එහි සාමාජිකයන්ගෙන්මයි. මොකද චෝර ධනපතියන්ව තමන්ගේ ආර්ථික උපදේශකයන් බවට පත් කරගෙන ඉන්න අපි ඊළඟට කළ යුත්තේ රාජ්‍ය බලය දිනා ගැනීම කියලා කියන ආණ්ඩුවකින් ඒ වගේ ප්‍රශ්න අහලා වැඩක් නැති නිසා.

‘නිර්භයත්වය සටන් තුළින් උපත ලබයි. එය පරීක්ෂණයෙන් පසක් කර ගනී.’

මෙහෙම ලියා තැබුවේ තැබුවේ ‘වානේ පන්නරය ලැබූ හැටි’ කෘතිය ලියපු නිකොලායි ඔස්ට්‍රොව්ස්කි. රුසියාවේ ඔක්තෝබර් විප්ලවය ජය ගන්නා විට ඔහුගේ වයස යන්තමින් අවුරුදු 13 ක්. පහළොස් හැවිරිදි වියේදීම ඔහුට සිවිල් යුද්ධයට සම්බන්ධ වෙන්න වෙනවා. ඒ වගේම විප්ලවයෙන් පස්සේ ඔහු කියෙවී, දුම්රිය පොළ යළිත් ගොඩනැංවීමේ වැඩවලට සහභාගී වෙනවා. දවසකට පැය 12-14 ක් ඔහු දුම්රිය ස්ථානයේ අවන්හලේ වැඩ කරනවා. තවත් විටෙක ඔහු ගිනි උඳුන්කරුවෙකුගේ, විදුලි කාර්මිකයකුගේ අත් උදව් කරුවෙක් හැටියට වැඩ කරනවා.

ඔහු උක්රයිනයේ කොම්සොමොල් සංවිධානයේ වැඩවල යෙදුණේ තමාටම නුරු පුරුදු ආස්වාදයකින් හා උනන්දුවකින්.

වානේ පන්නරය ලබන්නේ ගිනි රත් කොට වහම දැඩි සීතට හසු කිරීමෙන්. සිවිල් යුද්ධයේ ගින්නෙන් හා සාමකාමී ඉදිකිරීමේ වැඩවලින් ඔහුගේ පරපුර පන්නරය ලැබුවා..

ස්වාර්ථකාමියා අන් හැමටම පෙර මිය යයි. ඔහු මෙලොව ජීවත් වන්නේ තමා සඳහා පමණකි. ඔහුගේ මමත්වය පැහැ කෙනෙහිම ඔහුට ජීවත්වීමට කිසිවක් නැත්තේය. එහෙත් මිනිහෙක් සමාජයේ උවමනාවන් සමඟ ජීවත් වන විට ඔහු සමාජය සමඟ එකට වෙළෙන විට ඔහු විනාශ කර දැමීම අසීරුය.

මේ යුගයේ අපට පාවෙල් කෝර්චාගින් ලා සිය දහස් ගණනක් ඇවැසිව තිබේ.

ලියොන් ට්‍රොට්ස්කි සහෝදරයාගේ පහත සඳහන් ප්‍රකාශය වත්මන් ලංකාවටද අදාළ වන බව හැඟී යන නිසා මෙහි උපුටා දක්වමි.

‘ඉතිහාසය පිළිබඳ විඤ්ඤානවාදී හා ලිබරල්වාදී සංකල්පයෙන් පැන නැඟී පැරණි ආප්තෝපදේශයක් පවතී. එනම් ‘සෑම ජනතාවක්ම ඔවුන්ට උචිත ආණ්ඩුවක් ලබාගනු ඇත.’ යන්නයි. ඉතිහාසය කෙසේ නමුත් පෙන්නුම් කරන්නේ එකම ජනතාවක් තුලනාත්මකව කෙටි කාල පරිච්ඡේදයක් ඇතුළතදී ඉතා විවිධ ආණ්ඩු ලබා ගන්නා බවයි. ජනතාවගේ ක්‍රමානුකූලව වැඩෙන පරිනත බව ආණ්ඩුවලින් ප්‍රකාශයට පත් නොවේ. ආණ්ඩුවක් වරක් බලය තහවුරු කරගත් පසුව එම ආණ්ඩුව ඇති කිරීමට තුඩුදුන් බලවේගයන්ගේ සම්බන්ධතාව නැතිවී යාමෙන් පසුවද පවතින්නට පුළුවන් බව අප තේරුම් ගත යුතුය.

ඇත්ත යථාර්ථයේදී නායකත්වයක් පන්තියක පොදු පිළිබිඹුවක් හෝ පන්තියේ නිදහස් නිර්මාණ ශක්තියේ ප්‍රතිඵලයක් හෝ නොවේ. වරෙක නායකත්වයක් පැන නැඟි කල්හි අනිවාර්යයෙන්ම පාහේ සිය පන්තියෙන් ඉහළට නගින එය එමගින් වෙනත් පන්තිවල පීඩනයන්ට දණ නමයි.

පරිපූර්ණ ලෙස ඇතුළතින් පරිහානියට පත්වී ඇති නමුත් දැවැන්ත සිදුවීම් මධ්‍යයේ මෙම පරිහානිය විදහා පෑමට අවස්ථාව නොලද නායකත්වයක් නිර්ධන පන්තිය දිගු කාලයක් තිස්සේ ‘ඉවසා සිටින්නට’ පුළුවන.

නායකත්වය හා පන්තිය අතර පරස්පර විරෝධය තියුණු ආකාරයෙන් එළිදරව් වීමට දැවැන්ත ඓතිහාසික කම්පනයන් අවශ්‍ය වේ.”

ලියොන් ට්‍රොට්ස්කි - (පන්තිය පක්ෂය හා නායකත්වය පොත් පිංචෙනි)

රාජ්‍ය ත්‍රස්තවාදී පනත එයි!
ජනතාවනි, ප්‍රහාරයකට සූදානම් වෙන්න

සැප්තැම්බර් 22 දිනැතිව "ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත" (PSTA) නමින් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. මෙය මූලිත්ම මේ වසරේ මූල ප්‍රකාශයට පත් කර, පසුව පෙබරවාරි මස අවසානය දක්වා මහජන අදහස් සඳහා විවෘත කළ කෙටුම්පතක්. මහජන අදහස් විමසීමේදී එවකට ප්‍රකාශයට පත්කර තිබූ කෙටුම්පතේ මූලික පදනම්වලටම බරපතළ විපර්යාසයක් එල්ල වුණා. නමුත් මෙම නව කෙටුම්පතේ එම මූලික පදනම් සියල්ල කිසිදු වෙනසකින් තොරව අන්තර්ගත කර තිබෙනවා. නිදසුනක් ලෙස මහජන අරගල ත්‍රස්තවාදී ක්‍රියා ලෙස නිර්වචනය කරන වගන්තිය කලින් එකේ 3, මේකේ 4. රඳවා තබා ගැනීමේ බලය විධායකයට පවරන වගන්තිය කලින් එකේ 29, මේකේ 27. ජනාධිපතිට සංවිධාන තහනම් කිරීමේ බලය සහිත වගන්තිය කලින් එකේ 63, මේකේ 59. ලේකම්වරයාට තහනම් ස්ථාන නම් කිරීමේ බලය දෙන වගන්තිය කලින් එකේ 66, මේකේ 60. මේ විදියට තිබුණු කෙටුම්පතම සම්බෝලයක් වගේ අනලා ඉදිරිපත් කරලා. එයින් පෙනී යන්නේ මහජන අදහස් විමසීම වංචාවක් සහ බොරුවක් බව. ජාතික ජන බලවේග ආණ්ඩුවට ගෙන ඒමට අවශ්‍ය පනත මේක. එම පනත කොහොම



විරෝධය නිසා එය හකුලා ගත්තා. නමුත් ගෝඨාභය පළවා හැරීමෙන් අනතුරුව අනුප්‍රාප්තික ජනාධිපති බවට පත්වූ අවස්ථාවේ රනිල් නැවත එයට උත්සාහ කළා. ඒ 2023දී 'ප්‍රති ත්‍රස්ත පනත' හෙවත් ATA ගෙන ආවා. එයටත් දැවැන්ත විරෝධයක් එල්ල වූ අතර ඒ විරෝධය තුළ ජාතික ජන බලවේගය සක්‍රියව සිටියා. වත්මන් අගමැතිනිය ATA ජනතාවට එරෙහි මර්දන උත්සාහයක් ලෙස හෙළා දකිමින් කළ පාර්ලිමේන්තු කතාවක් අදත් අපට

කියන්නේ වැටුප් වැඩි කරන්න කිව්වත්, ඉන්දියාව සමග ආරක්ෂක ගිවිසුම් ගහන්න එපා කිව්වත් ත්‍රස්තවාදී කියලා කියන්න ඉඩ ඉතිරි කරගෙන තිබෙනවා. මේ පනත සම්මත වුණොත් කාටවත් ආණ්ඩුවට මේක කරන්න, මේක කරන්න එපා කියලා බලපෑම් කරන්න පුළුවන් කමක් නැහැ. එහෙම කළොත් ඒක වැටෙන්නේ ත්‍රස්තවාදී ක්‍රියා ගොඩට. උද්ඝෝෂණය කිරීම විරෝධය ප්‍රකාශ කිරීමේ වගතිය) යුද්ධයෙන් පසු ප්‍රතිසන්ධාන කොමිසම නිර්දේශ කළා පොලිසිය සහ හමුදාව තනි අමාත්‍යාංශයකින් පාලනය කරන්නත් එපා, දෙකක් හදන්න කියලා. මහජන ආරක්ෂක අමාත්‍යාංශය හැදුවේ එහෙම. දැන් ඒ ඔක්කොම නොසලකා හමුදාවට පොලිස් බලතල දෙන්න යන්නේ සිවිල් ජනතාවට මුහුණ දෙද්දී සන්නද්ධ බලය භාවිතා කරන්න ඕන නිසාද? මීට අමතරව තවත් බොහෝ කරලා රජාව පළවා හැර රජකම ගත්තාව. හැබැයි මේ රජ්ජුරුවන්ට තිබුණා හැමවෙලාවෙම මත්පැන් බීමේ කැදරකමක්. ඒ නිසා හැමවෙලාවෙම ඔහුගේ කටේ තිබුණේ "දාසිය මධු බඳුනක් ගෙනෙව" කියන වාක්‍යය. දැන් දොරටුපල්ලා රජ වුණාට පස්සේ ඔහුටත් මේ ලෙඩේම බෝ වුණා. ඔහුත් හැමවෙලාවෙම දාසිය මධු බඳුනක් ගෙන එව කියන්න පටන් ගත්තා. දැන් ජාජබ ආණ්ඩුවටත් වෙලා තියෙන්නේ ඒ දොරටු පල්ලට වුණ දේම තමයි. රජාව එළවලා රජ කම ගත්තට අර රජාගේ තිබුණු ජඩ ගති අමතක කරන්න ආණ්ඩුවට බැරිවෙලා තියනවා. ඒ නිසා තමයි පනුගිය කාලේ රනිල්ට රාජපක්ෂලාට සම්මත කරගන්න බැරි වුණ මර්දන අණ පනත් මේ ආණ්ඩුවත් කර තියාගෙන දුවන්නේ. මේක ඇත්තටම ඉතිහාසයේ සරදමක් තමයි. නමුත් මේක සරදමක් පමණක් නෙවෙයි, භයානක මර්දන උත්සාහයක්. ඒ මර්දන උත්සාහයේ බරපතළකම විසින් පෙන්වන්නේ නව ලිබරල් ධනවාදී පාරේ යනවා නම්, IMF කප්පාදු පිළිවෙළක් දිගේ දිගටම යනවානම් ප්‍රජාතන්ත්‍රවාදය දෙන්න බෑ කියන එක. ආණ්ඩුව IMF ප්‍රතිපත්තියේ තමයි දිගින් දිගටම ගමන් කරන්නේ. ධනකුවේරයන්ට සහන දෙන ගමන් ආණ්ඩුව සාමාන්‍ය ජනතාව මත විශාල බදු බරක් පටවමින් යනවා. මේ කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තිය දිගටම ක්‍රියාත්මක කරන්න නම් ආණ්ඩුවට වෙනවා සටන් කරන විරුද්ධ වෙන අයගේ කට වහන්න.

පරදවමු!

මෙය පාලක පන්තිය වැඩකරන පන්තියට එරෙහිව යුද්ධ ප්‍රකාශ කිරීමක්. මේ උත්සාහ කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා රාජ්‍යය සහ ජනතාව අතර බලතල බෙදාග නීමේ බල තුලනයේ පාලක පන්තියේ බලය. රාජ්‍යයේ බලය වැඩි කරලා ජනතාවගේ, නිර්ධන පන්තියේ බලය අඩු කරන්න. මේ PSTA කියවා ගත යුත්තේ හුදෙකලාව නෙවෙයි, 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සමග, නව දූෂණ විරෝධී සංශෝධන පනත සමග, ඒ වගේම දැනට ක්‍රියාත්මක වන මාර්ගගත ක්‍රමවල ආරක්ෂාව පිළිබඳ පනත (OSA) , සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත (ICCPR) වැනි මර්දනීය අණපනත් සියල්ල සමග සංයුක්තව. එවිට අපට පෙනී යනවා මේ කරන්නේ රාජ්‍යය ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීමක් නෙවෙයි, ජනතාවට එරෙහිව රාජ්‍ය ත්‍රස්තවාදය යෙදවීම සඳහා රාජ්‍යය ශක්තිමත් කර මර්දනයේ දත් හා නිය මුළහත් කිරීමක් බව.

මෙය අනිවාර්යයෙන්ම පරාජය කළ යුතුයි. ඒ සඳහා වැඩකරන ජනතාව ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිළිබඳ සංවේදී සියලු දෙනා එක මිටකට එකතු විය යුතුයි. වෙන උත්තරයක් නෑ.

සුභ සහ යස

අතීතයේ දවසක මේ රටේ වේදිකාගත වුණා සුභ සහ යස කියලා නාට්‍යයක්. මේ ලිව්වේ සයිමන් නවගත්තේගම කියන සාහිත්‍යකරුවා. මේකෙ තියෙන්නේ යසලාලක තිස්ස රජ්ජුරුවන්ගේ කතාව. රජ්ජුරුවෝ වගේම දොරටු පල්ලෙක් කුමන්ත්‍රණයක්

1917 ඔක්තෝබර් විප්ලවය
වත්මන් විප්ලවයේ මග සලකුණක් ලෙස

ඔක්තෝබර් විප්ලවය, නිර්ධන පන්තියේ පළමුවැනි විප්ලවකාරී නැගිටීමෙන් එනම් 1871 පැරිස් කොමියුනය පරාජයෙන් පසු ජයග්‍රාහී සමාජවාදී විප්ලවයයි.

සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුරේ බිඳවැටීමත් සමග අධිරාජ්‍යවාදී කඳවුර එක්සත් ජනපදයේ තනි බලය ලෙස ප්‍රමුඛත්වයට පැමිණියේය. ජයග්‍රාහී ලෙස ෆ්‍රැන්සිස් ෆුකුයාමාගේ නිබන්ධනයෙන් 'ඉතිහාසයේ අවසානය' නිවේදනය කළද ඉන්පසු වසර කිහිපයේදීම එම ප්‍රවාදය පවා යල් පිනූ දෙයක් බවට පෙරළුණි. ලොව පළමු සමාජවාදී විප්ලවයෙන් බිහි කළ සමාජවාදී රාජ්‍ය අද වන විට ඉතිහාසගත පරාජයක් ලෙස බොහෝ දෙනා පිළිගනී. නමුත් එය පරාජයක් යැයි කිව නොහැකි තරමට ලොව පුරා සමාජවාදී ව්‍යාපාර ඔක්තෝබර් විප්ලවයේ ඓතිහාසික ජයග්‍රහණය කියවා ගනිමින් 21වන සියවසේ සමාජවාදය යන තේමාවෙන් සක්‍රිය වෙමින් තිබේ. කොමියුනිස්ට් ප්‍රකාශනය ආරම්භයේදී කෙමියුනිස්ට්වාදයේ අවතාරය ගැන සඳහන් කළ අතර කවර විවේචන, අවලාද, පසුවිපරම් මධ්‍යයේ වුවද වත්මන් අධිරාජ්‍යවාදී ලෝකය තුළ හොල්මන් කරන්නේ රුසියානු සමාජවාදී විප්ලවයේ අවතාරයයි.

අප සමාජවාදී විප්ලවයක් වෙනුවෙන් රුසියානු විප්ලවය ඓතිහාසික ජයග්‍රහණයක පදනමින් විමසා බලන විට ප්‍රධාන කරුණු කිහිපයක් අවධානයට ලක් කළ යුතුව ඇත. පළමුව, ඔක්තෝබර් විප්ලවය ජයග්‍රහණය වෙනුවෙන් ක්‍රියාත්මක වූ බොල්ෂෙවික් පක්ෂයේ ක්‍රියාකාරිත්වයයි. එසේම සළකා බැලිය යුතු වන්නේ විප්ලවකාරී නැගිටීමකට පසුබිම් වූ රුසියානු සමාජ ආර්ථික දේශපාලන පසුබිමයි. අප සමාජවාදී ජයග්‍රහණ අපේක්ෂා කරන සමාජ ව්‍යාපායක් ලෙස රුසියානු විප්ලවය සළකා බැලිය යුතු වන්නේ අප මුහුණ දෙමින් සිටින අභියෝග ඔස්සේය. 21 වන සියවසේ මානව වර්ගයා දැන් මුහුණ දී සිටින ගෝලීය පරිමාණ අර්බුදය තුළින් සහ එහි විනාශකාරී පැවැත්මෙන් මුදා ගැනීම විප්ලවවාදී ව්‍යාපාරයක අද දවසේ කාර්යභාරයයි. එහිදී ධනපති සමාජ ආර්ථික ක්‍රමයේ ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී බලය අවසන් කර වැඩකරන ජනතාවගේ බලයක් පිහිටුවීමත්, ලෝක ආර්ථිකය විද්‍යාත්මක ආකාරයෙන්, එනම් සමාජවාදී පදනමක ප්‍රතිසංවිධානය කිරීමේදී 1917 ඔක්තෝබර් විප්ලවයේ පාඩම් හැදෑරිය යුතු වේ.

අද වනවිට ලෝකයේ සියයකට අඩු පුද්ගලයන් කණ්ඩායමක් සමස්ත ලෝක ජනගහනයෙන් හතරෙන් තුනක් සතු පංගුවටත් වැඩි ධනයක් අත්පත් කරගෙන පාලනය කරති. ධනපති සමාජයේ සැබෑ ස්වභාවය එහි අයුක්ති සහගත තත්වය, සනාථ කරමින් උමතු ආකාරයෙන් පෞද්ගලික ධන සම්පත් ගොඩ ගසමින් තිබේ. පසුගිය සියවසේ ධනපති ක්‍රමය යටතේ සටන්කාමී වැඩකරන ජනතාව දිනාගත් සෑම තිරණාත්මක සමාජමය ජයග්‍රහණයක්ම එනම්, අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස හා විශ්‍රාම ජීවිතය වැනි සීමිත ප්‍රතිසංස්කරණ පවා අතුගා දමමින් මිනිස් සමාජය පසුපසට ගමන් කරමින් සිටී. එම පසුබිම තුළ සමාජ ජයග්‍රහණ වෙනුවෙන් වැඩකරන අපගේ ව්‍යාපාරය තුළට ඔක්තෝබර් විප්ලවයේ පාඩම් අදාළ කරගන්නේ කෙසේද යන ප්‍රශ්නය පැන නගී. එහිදී රතු ඔක්තෝබරයේ අසහාය නායකයාගේ පුද්ගල මැදිහත්වීම මෙන්ම පීඩිත පන්ති බලවේග සංවිධානය කිරීම කෙරෙහි ඔහු දැක්වූ ප්‍රමුඛතාව අමතක කළ නොහැකිය. සමාජ බලවේග හඳුනා ගනිමින් දේශපාලන තීරණ ගැනීමේදී ලෙනින් දැක්වූ ශ්‍රේෂ්ඨ සහ එම තීරණ ජයග්‍රහණය කරා ගෙන යාමට දැක්වූ කැපවීම, නුදෙක් විසුක්ත හා බුද්ධිමය ස්වභාවයක පැවතියේ නැත. දේශපාලන වර්ධනයන් පිළිබඳ නිවැරදි අවැයිමක් පවත්වා ගෙන යාම, ඒ ඔස්සේ නිර්ධන පන්තියේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය ගමන්මග නිර්ණය කිරීම හා එහිදී නිවැරදි දේශපාලන හා ප්‍රායෝගික දිශානතියක් සම්පාදනය කිරීම සඳහා ලෙනින් කළ අරගලය තීරණාත්මක ලෙස බලපෑවේය..

1917 ඔක්තෝබරයේ අත්දැකීම්වලට පසුබිම් වූයේ ඊට දශක ගණනක් පූර්වයේ ආරම්භ වූ ක්‍රියාදාමයකි. රුසියානු සාර් අධිරාජ්‍යයේ දේශපාලන තීරණ, නියැදිය ලෙස රුසියානු භූමියේ නාගරිකව නැගී එමින් තිබුණු ධනවාදය වෙත යුරෝපා ප්‍රාග්ධන ආධිපත්‍යයේ බලපෑම් විශේෂය. පීඩිත, ගොවි ජනතාව කැරලිකාරී ලෙස සංවිධානය වෙමින් පැරණි වැඩවසම් සාර් ආධිපත්‍යයේ කෲර පාලනයේ හා රදළ ඉඩම්හිමි පැලැන්තියේ වියගසින් මිදීමට සටන ආරම්භ කර තිබිණි. කම්කරු පන්තිය දසක ගණනක් සිය අයිතිවාසිකම් හා සේවා කොන්දේසි යහපත් අතට පෙරළා ගැනීමේ අරගලවලදී දේශපාලන පාඩම් ඉගෙන ගනිමින් සිටියේය. දේශපාලන අධ්‍යයන කවවල වාද විවාද කරමින් තමන්ගේ අවට ලෝකයේ පීඩාව හමුවේ කුමක් කළ යුතුද යන ප්‍රශ්නය මාක්ස්වාදීහු අධ්‍යයනය කරමින් සිටියහ. රුසියානු විප්ලවවාදී ව්‍යාපාරය මෙහෙයවීමේදී ලෝක පරිමාණ තත්වයන් හා රුසියානු දේශපාලන තත්වය සළකා බලමින් විප්ලවය කිව් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට 1917 ලෙනින් ලියූ අප්‍රේල් තීසීසයන් මග පෙන්වීමක් විය. එය 1893 පමණ රුසියානු ගොවි ජීවිතය තුළ දේශපාලන වර්ධනයන් අළලා ලෙනින් ලියූ ලේඛන, අවස්ථාවාදයට එරෙහිව අඛණ්ඩ දේශපාලන අරගලයට දායකත්වය දෙමින් සහ විවිධ ලේඛන ඔස්සෙ නිර්ධනා පන්තික මතවාදී ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වය තුළ ඉදිරි පියවරක් විය.

1917ට පෙර වසරවල ලෙනින් ඇතුළු බොල්ෂෙවික් නායකත්වයේ ප්‍රමුඛ කාර්යභාරයක් වූයේ, වර්ධනය වෙමින් පවතින දේශපාලන තත්වයන් අධ්‍යයනය කරමින් පන්ති අරගලයේ ඉදිරි අවස්ථා වෙනුවෙන් දේශපාලන ක්‍රියාකාරිත්වය පිළිබඳ තීන්දු ගැනීමයි. දෙන ලද සමාජයක සිදුවෙමින් තිබෙන වර්ධනයන් සළකා බලමින් එම සමාජයේ ජයග්‍රහණ වෙනුවෙන් නිර්ධන පන්තියේ පෙරටුගාමී බලඇණිය ලෙස පක්ෂයට ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීම නමැති වගකීම ඔවුහු ඉටු කළහ.

1914දී ලෝක යුද්ධය ඇවිළයාමත් සමග, ලෝක පරිමාණ ධනේශ්වරයේ අර්බුදය පිළිබඳ ලෙනින් කළ අධ්‍යයනය, බොල්ශෙවික් පක්ෂයේ විප්ලවකාරී ක්‍රියාකාරිත්වයට තීරණාත්මක මග පෙන්වීමක් විය. ලෙනින් කියා සිටියේ මෙම යුද්ධය අවසාන කළ හැකි එකම මග රටවල් ගණනාවක කම්කරුවන්ගේ විප්ලවයක් වන බවත් රුසියානු නිර්ධනයන්ගේ පක්ෂය එම විප්ලවයට රුසියානු සීමාවේ කටයුතු සූදානම් කරමින් ලෝක පරිමාණ විප්ලවයට ආධාර අනුබල දිය යුතු බවත්ය.

විප්ලවයක් යනු සාමකාමී ලෙස බලය අත්පත් කරගන්නා දෙයක්ද යන ප්‍රශ්නය අතැතිව, බොල්ෂෙවික් පක්ෂයට බලය අත්පත් කරගන්නේද එය ආරක්ෂා කරගත හැකිද යන ප්‍රශ්නය එවකට රුසියානු ධනේශ්වර බුද්ධිමතුන්ගේ මානසිකාවක් විය. එවැනි ප්‍රශ්න කිරීම්වලට ප්‍රතිචාර ලෙස ලෙනින් ස්ටීර ලෙසම කියා සිටියේ එවැනි විප්ලව කිසිදා ඇති නොවන බවයි. විප්ලවයේ වර්ධනය විසින් සුවිශේෂී සංකීර්ණ තත්වයන් නිර්මාණය කරනු ඇති බව මාක්ස් උපුටමින් ඔහු අදහස් පළ කළේය. මාක්ස් ප්‍රකාශ කළ පරිදි පැරණි ක්‍රමයක් එහි පීඩිතව ජීවත් වූ කෝටි සංඛ්‍යාත ජනයාගේ ජීවන මාදිලියක් අවසන් කරමින්, නව සමාජ පරිසරයකට උපත දීම, ඇදහිය නොහැකි තරම් සංකීර්ණ වූත් වේදනාකාරී වූත් ක්‍රියාවලියකි. විප්ලවයේදී පවතින තත්වයන් මහා පරිමාණයෙන් හා සුවිශේෂී ලෙස සංකීර්ණ නොවේ නම්, එවිට විප්ලවයක් ඇති නොවනු ඇත. වාක්‍යයන්ට බිය නම්, ඔබ කැලෑවට නොයා යුතුය. ලෙනින් නිශ්චිතව අවධාරණය කළේ එයයි.

මෙම පසුබිම තුළ අප අපේ විප්ලවවාදී දේශපාලනයේ වැඩපිළිවෙළ හා ඉදිරි ක්‍රියාමාර්ග, ඔක්තෝබර් විප්ලවයේ පාඩම්වලට සම්බන්ධ කරගත යුතු වේ.

සමාජ විප්ලවයක් ඇති වන්නේ, අවම වශයෙන් විප්ලවකාරී තත්වයක් වර්ධනය වන්නේ පාලක පන්තීන්ට පැරණි ආකාරයට සිය පාලනය ගෙනයාමට නොහැකි වන විට සහ පාලිත ජනතාවටද පැරණි ආකාරයට තවදුරටත් ජීවත් විය නොහැකි වූ විටය. අප සමාජයේ මෑතකාලීන දේශපාලන අත්දැකීම්වලින් කියා පාන්නේද එයමය. 2022 මහජන නැගිටීම එහි මධ්‍යම පාන්තික අන්තර්ගතය සහිතව වුවද සළකා බැලිය හැක්කේ සටන් පාඩයක් ගෙන කිසිදා මහමගට නොපැමි, පිරිසකට ජනාධිපතිවරයකු පළවා හරින තෙක් එම අරගලයට පක්ෂපාති වන්නට මග පෑදූයේ පැවති අවම දේපලවල කොන්දේසි යටතේ පවා තවදුරටත් සාමාන්‍ය ජීවිතයක් පවත්වා ගෙන යා නොහැකි වූ නිසාය.

අප ජීවත්වන සමාජයේ සත්‍ය ස්වරූපය කියාපාන දත්ත කිහිපයකින් මේ කාරණය පැහැදිලි කරගත හැකිය. ලෝකයේ ප්‍රමුඛතම බිලියනපතියන් සතු සමස්ත වත්කම් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 20.1 ක් පමණ වේ. Forbes සඟරාවේ නවතම වාර්තා අනුව ලොව පුරා විසිරී සිටින බිලියනපතියන් 3,428ක් විසින් මෙම දැවැන්ත වත්කම් ප්‍රමාණය පාලනය කරනු ලබයි. ගෝලීය ධන ව්‍යාප්තියේ පවතින දැඩි අසමානතාවය හේතුවෙන් ලෝකයේ ධනයෙන් අතිවිශාල කොටසක් හිමිවන්නේ ඉතා සුළු පිරිසකට පමණි. සමස්ත ලෝක ජනගහනයෙන් 1% ක් වන ධනකුබේරයන් කණ්ඩායමක්, ලෝකයේ සමස්ත ධනයෙන් 45% කට වඩා වැඩි ප්‍රමාණයක් පාලනය කරයි. එසේම, ලෝක ජනගහනයෙන් අඩක්, එනම් දිළිඳුතම සහ පහළ මධ්‍යම පාන්තික ජනතාවගෙන් 50% කටම හිමිවන්නේ සමස්ත ලෝක ධනයෙන් 1% කටත් වඩා අඩු (0.75% ක පමණ) ඉතා සොච්චම් වත්කම් ප්‍රමාණයකි. සමස්ත ලෝකයෙන් 99% කට හිමිවන්නේ ලෝක ධනයෙන් 55% කට අඩු ප්‍රමාණයකි.

ලංකාව සැළකූ විට ධනවත්ම 1% කණ්ඩායම රටේ සමස්ත ජාතික ධනයෙන් 31% කට වඩා වැඩි ප්‍රමාණයක් අත්පත් කරගන්නා අතර ආර්ථික හැකියාවෙන් පහළම 50% ක කණ්ඩායම සතු වන්නේ සමස්ත ජාතික ධනයෙන් 4% ක් වැනි අඩු ප්‍රතිශතයකි. රටේ සමස්ත වාර්ෂික ආදායමෙන් 50% ක් පමණ ධනවත්ම 20% ක් අතර බෙදී යන අතර පහළම 20% ක් සතු වන්නේ 5% ක ආදායමයි.

විප්ලවයක අවශ්‍යතාව පෙන්නුම් කරන්නේ මෙම ලෝක පරිමාණ තත්වය හා ලාංකීය තත්වය සළකා බලන විට පමණක් නොවේ. මේ වන විට ලෝකය පුරා සිය කෘර ප්‍රාග්ධන යාන්ත්‍රනය වෙනුවෙන් නැවත අත්පත් කරගන්නා දේශපාලන, ආර්ථික හා මිලිටරි ක්‍රියාමාර්ගවලට අධිරාජ්‍යවාදී ධනපති පන්තිය එළඹ සිටී. මිහිතලය වැනසී යාමට තුඩු දිය හැකි න්‍යෂ්ටික යුද්ධයක අනතුර වර්ධනය වෙමින් පවතී. එහෙත් මේ අතරම සමාජවාදී ජයග්‍රහණ අරමුණු කරගත්, විවිධ සමාජ ව්‍යාපාර සක්‍රිය වෙමින් අධිරාජ්‍යවාදයට පරාජයත් ජනතාවට ජයග්‍රහණයත් ප්‍රාර්ථනා කරමින් දේශපාලන ක්‍රියාකාරිත්වයක සිටී. ඔවුන් සියල්ලෝ එසේ යෙදී සිටින්නේ මාක්ස්වාදී අර්ථයෙන් නොවන නමුත් ඔවුන් සියල්ලන්ම නියෝජනය කරන්නේ සමාජ විප්ලවයක සාධනීය ජයග්‍රහණවලට ඇති නොතිත් ප්‍රාර්ථනාවයි. ඒ අභිලාෂය ජයග්‍රහණය කරවන්නට හැකි දුර්වශය බලවේගය වන්නේ ගෝලීය පරිමාණ වැඩකරන ජනතාවයි. ඒ නිසා වැඩ කරන ජනතාව පදනම් කරගෙන දේශපාලනය කිරීම, විමුක්ති දේශපාලනයේ නිර්ධන පාන්තික පාර්ශ්වය ශක්තිමත් කිරීම මාක්ස්වාදී විප්ලවවාදී ව්‍යාපාරයක ප්‍රමුඛ කාර්යභාරයයි.

වත්මන් දේශපාලන පසුබිම තුළ මෙය ප්‍රායෝගික ලෙස ක්‍රියාවට නගන්නේ කෙසේද යන්න දුෂ්කර අභියෝග යකි. අප ගෙන යන නිර්ධන පාන්තික වැඩපිළිවෙළ සහ බහුජන දේශපාලන ආමන්ත්‍රණය අඛණ්ඩව හා සමාන්තරව විප්ලවයේ අරමුණු සමග සම්බන්ධ කිරීමත් අවශ්‍ය වේ. වර්ධනය වන සමාජ දේශපාලන තත්වයන් විශ්ලේෂණය කරමින් විප්ලවයට පක්ෂපාති ලෙස ඉදිරි ක්‍රියාමාර්ග තේරීම අද දවසේ මාක්ස් - ලෙනින්වාදයේ එනම් සමාජවාදී සමාජ විප්ලවයක් අරමුණු කරගන්නා දේශපාලන ව්‍යාපාරයක කාර්යභාරයයි.





වැල යන අතට මැස්ස, ගැහීම

විවිධ සංවිධාන සමාජ ක්‍රියාකාරීන් ගොව්වන් මෙන්ම සාමාන්‍ය ජනතාව විසින් සිදුකළ අරගලයක ප්‍රතිඵලයක් ලෙස. 2021 වසරේ දී පැනවූ කටුපොල් (Palm Oil) වගාවට අදාළ තහනම ඉවත් කරන බව සමන්ත විද්‍යාරත්න ඇමතිවරයා විසින් පවසා තිබේ. ඔහුට අනුව මේ තහනම කර ඇත්තේ කිසිදු පදනමකින් නොවෙය. ඒ ගැන සොයා බැලීමට කමිටුවක් ද පත්කර ඇති අතර, එය නුදෙක් ලංකාවේ සාමාන්‍ය ජනතාව සුරාකෑමේ ව්‍යාපෘතිය වඩා හොඳින් සිදුකරන සමාගමක වුවමනාව මත ක්‍රියාත්මක වන බව පෙනී යයි. එහෙත් මෙයින් සිදුවිය හැකි බරපතළ පරිසර හානි පිළිබඳව ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලද පර්යේෂණයකදී හෙළි වී තිබේ. මේ සියල්ල පසෙක දමා සමාගම් තරකිරීමේ වුවමනාව මත මේ ආණ්ඩුව කිසිදු පාරිසරික, සමාජීය හෝ කෘෂිකාර්මික අවශ්‍යතා නොසලකා තීරණ ගන්නා බව පැහැදිලිය.

ලංකාවේ දකුණු පළාත් තෙත් කලාපීය ප්‍රදේශ යනු ජෛව විවිධත්වයෙන් අතිශය පොහොසත්, ජල පෝෂක ප්‍රදේශයන්ගෙන් පිරුණු කලාපයකි. කටුපොල් වගාව ව්‍යාප්ත වීමත් සමග මෙම ප්‍රදේශයන්හි මතුව ඇති ප්‍රධානතම ගැටලුව වන්නේ භූගත ජල මට්ටම ශීඝ්‍රයෙන් පහළ යාමයි. වැඩුණු කටුපොල් ගසක් දිනකට ජලය ලීටර් 200ත් 300ත් අතර ප්‍රමාණයක් උරාගන්නා අතර, එමඟින් අසල ඇති පානීය ජල උල්පත්, කුඹුරු සහ ඇළ දොළ සිදී යාමේ අවදානමක් මතුව ඇත.

ඊට අමතරව, ඒක - වගාවක් (Monoculture) ලෙස කටුපොල් වගා කිරීම නිසා පසෙහි පෝෂණ ගුණය වේගයෙන් ක්ෂය වේ. අධික ලෙස රසායනික පොහොර, විල්නාශක සහ පලිබෝධනාශක භාවිත කිරීමට සිදුවීමෙන් පසෙහි ජීවත් වන හිතකර ක්ෂුද්‍ර ජීවීන් විනාශ වන අතර, වැසි ජලය සමඟ මෙම රසායනික ද්‍රව්‍ය ගලා යාමෙන් දේශීය ජල මූලාශ්‍ර දූෂණය වේ. එමෙන්ම රබර් හෝ දේශීය වනාන්තර හෙළි කරමින් කටුපොල් වගා කිරීම නිසා ප්‍රදේශයට ආවේණික සතුන්ගේ වාසස්ථාන ද අහිමි වී යයි.

මෙහි තවත් වැදගත් පාඩමක් ඇත. පැරණි වගා භූමියක් කටුපොල් වගාවකට යොදාගැනීමත්, ස්වභාවික වනාන්තරයක් කපා කටුපොල් වගාවක් ඇති කිරීමත් එකම දෙයක් නොවේ. ලෝක පර්යේෂණවලින් පෙන්වා දෙන්නේ ස්වභාවික වනාන්තර කටුපොල් වගාවට පරිවර්තනය කිරීමේදී ජෛව විවිධත්ව හානිය වඩාත් බරපතළ විය හැකි බවයි.

ගෝලීය වශයෙන් මෙම කටුපොල් වගාව නිසා සිදුවී ඇති විනාශය ඉන්දුනීසියාව සහ මැලේසියාව දෙස බලන විට අපට හඳුනාගත හැකි හොඳම හා ළඟම උදාහරණ වේ. ලෝක 'කටුපොල් තෙල්' නිෂ්පාදනයෙන් 85% කට වඩා වැඩි ප්‍රමාණයකට දායක වන ඉන්දුනීසියාව සහ මැලේසියාව වැනි රටවල් කටුපොල් වගාව නිසා අතිමහත් පාරිසරික ඛේදවාචකය කට මුහුණ දී සිටී.

කටුපොල් වගාව සඳහා අක්කර මිලියන ගණනක නිවර්තන වැසි වනාන්තර සහ පීට් පස් (Peatlands) සහිත භූමීන් ගිනි තබා හෙළිපෙහෙළි කර ඇත. මෙයින් විශාල කාබන් ප්‍රමාණයක් වායුගෝලයට මුදාහැරීම නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට (Climate Change) එය සෘජුවම බලපා තිබේ.

ඒ අතරම ඔරංඔටන්, සුමාත්‍රා අලි සහ ව්‍යාඝ්‍රයන් වැනි වඳවීමේ තර්ජනයට ලක්වූ සතුන්ගේ ස්වාභාවික වාසස්ථාන විනාශ වීම නිසා උන්ගේ ගහනය ශීඝ්‍රයෙන් පහළ බැස ඇත.

වසර ගණනාවක් කටුපොල් වගා කළ භූමීන් පසුව වෙනත් කිසිදු කෘෂිකාර්මික කටයුත්තකට යොදාගත නොහැකි තරමට නිසරු වී, කාන්තාරකරණයට ලක්වීමේ ප්‍රවණතාවක් මතුව තිබේ.

මේ ලෝකයේ රටවල් දෙකක අත්දැකීම් පමණි. ස්වාධීන පාරිසරික බලපෑම් ඇගයීමක් කළ යුතුය. ජල මූලාශ්‍ර ආරක්ෂිත කළ යුතුය. ඉඩම් අයිතිය පැහැදිලි කළ යුතුය. ප්‍රදේශවාසීන්ට තොරතුරු ලබාදිය යුතුය. ඔවුන්ගේ අදහස් සැබෑ ලෙස සලකා බැලිය යුතුය. පරිසර හානියක් සිදුවුවහොත් එය යථා තත්වයට පත් කිරීමේ වගකීමද වගාකරුවාට තිබිය යුතුය.

එවිට පමණක් ආර්ථික ක්‍රියාකාරකමක් සමාජ වගකීමක් සහිත සංවර්ධනයක් බවට පත්විය හැකිය.

අවසානයේ අප ඇසිය යුතු ප්‍රශ්නය කටුපොල් පිළිබඳ පමණක් නොවේ.

අපි සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

අද වැඩි ලාභයක් ලබාගෙන හෙට ජලය සොයා දුවන සමාජයක්ද?

අද ඉඩමෙන් ආදායමක් උපයාගෙන හෙට එම ඉඩමේ ජීවත් වූ ජනතාවට ඉඩක් නැති සමාජයක්ද?

නැතහොත් ආර්ථිකයත්, පරිසරයත්, මිනිසාත් එකිනෙකාගේ සතුරන් නොකර ගනිමින් ඉදිරියට යන සංවර්ධනයක්ද?

දකුණු ලංකාවේ කටුපොල් ප්‍රශ්නය අප ඉදිරියේ තබන්නේ එම විශාල ප්‍රශ්නයයි.

ලාභය ගණනය කරන විට පරිසරයේ වටිනාකමත්, ජනතාවගේ ජීවිත වටිනාකමත් ගණනය නොකළහොත්, අද ලාභය ලෙස පෙනෙන දේ හෙට සමාජය ගෙවන ණයක් විය හැකිය.

යුද්ධය ප්‍රවර්ධනය කළ මහා මණ්ඩල සැසිය



මෙම වසරේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිය ඇමෙරිකානු සහ යුරෝපීය අධිරාජ්‍යවාදී බලවතුන් විසින් යුද සමූළුවක් බවට පරිවර්තනය කරනු ලැබ ඇත.

සැප්තැම්බර් මුලදී ආරම්භ වූ මෙම සැසිය, ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ඉරාණය 'සම්පූර්ණයෙන්ම විනාශ කරන' බවට තර්ජනය කරමින් ජන සංහාරක ප්‍රහාරාත්මක කතාවක් පැවැත්වූ අතර, බදාදා දින යුක්ත්‍රේන ජනාධිපති ව්ලැදිමීර් සෙලෙන්ස්කිගේ අදහස් දැක්වීමෙන් එය තවත් උච්චතම අවස්ථාවට ළඟා විය. එහිදී ඔහු රුසියාව මිලිටරිමය වශයෙන් පරාජය කරන ලෙස ඉල්ලා තිබේ.

පසුව මහා මණ්ඩලය ඇමතූ නේටෝ (NATO) මිත්‍ර පාක්ෂිකයන් කිහිපදෙනෙකු ද අදහස් දැක්වූයේ එම පදනමේ සිටමය. 'අප සියලු දෙනා එකතුවී රුසියාවට යුක්ත්‍රේනය තුළ සාමය ඇති කිරීමට බලකළ යුතුය' යනුවෙන් එස්තෝනියානු ජනාධිපති අලාර් කරිස් පැවසීය. රුමේනියානු ජනාධිපති නිකුසෝර් ඩැන් ප්‍රකාශ කළේ, 'අප රුසියානු තර්ජනය වැළැක්විය යුතු අතර, අවාසනාවකට මෙන් අපට එය කළ හැක්කේ මිලිටරිමය වියදම් ඉහළ නැංවීමෙන් පමණි' යනුවෙනි. රුමේනියාව මිලිටරිමය වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% දක්වා ඉහළ නැංවීමේ නේටෝ ඉලක්කයට සහය දක්වන බවත්, මෙවසරේදී එය 3.7% දක්වා ළඟා වන බවත් වැඩිදුරටත් පැවසීය.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසියට සමගාමීව ඉරාන නිලධාරීන් ඇමෙරිකානු විශේෂ නියෝජිත ස්ටීව් විට්කොෆ් සමග පැය තුනක සාකච්ඡාවක් පැවැත්වූ බව ඩොනල්ඩ් ට්‍රම්ප් අගහරුවාදා අනාවරණය කර තිබුණි.

එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් සිය ධුර කාලය අවසන් වීමට පෙර පැවැත්වූ අවසන් දේශනයේදී කියා සිටියේ, ලෝකයේ අනාගතය තීරණය වන්නේ අභියෝග හතරක් මගින් බවයි. එනම් කෘතිම බුද්ධිය (AI), කාලගුණික විපර්යාස, යුද්ධ සහ අසමානතාව යි.

නමුත් මේ කිසිදු අභියෝගයක් ජයගැනීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ට සිදුකළ හැකි දෙයක් නොමැති බව මෙම සැසිය තුළදීම විවිධ සිදුවීම් හරහා අනාවරණය විය.

ජර්මන් ප්‍රාන්ත මැතිවරණයේදී දක්ෂිණාංශය ඉදිරියට



සුගියදා ජර්මනියේ බර්ලින් සහ මෙක්ලෙන්බර්ග-බටහිර පොමරේනියා යන ප්‍රාන්තවල පැවැති මැතිවරණ දේශපාලන භූමිකම්පාවක් නිර්මාණය කර ඇත. එම මැතිවරණ දෙකම කැපී පෙනුණේ මධ්‍යම රජයේ යුද්ධවලට සහය දක්වන සහ කප්පාදු (අරපිරිමැසුම්) ප්‍රතිපත්තිවලට එරෙහි වූ විරෝධයක් ලෙසයි. කෙසේ වෙතත්, මාධ්‍ය ඉදිරියට පැමිණි චාන්සලර් ෆ්‍රීඩ්රිච් මේර්ට්ස් (Friedrich Merz) ප්‍රකාශ කළේ, ඡන්දදායකයන් කෙසේ ඡන්දය භාවිත කළද, තමා සිය න්‍යාය පත්‍රය ඉදිරියටම ගෙන යන බවත් එය තවත් වේගවත් කරන බවත්ය.

ජර්මනියේ වාම නැඹුරුවක් සහිත (Die Linke - වම) පක්ෂය බර්ලින් ප්‍රාන්ත මැතිවරණයෙන් පළමු ස්ථානය දිනාගෙන ඇති අතර, අන්ත දක්ෂිණාංශික පක්ෂයක් වන ඔල්ටර්නේටිව් ෆෝ ඩොයිචිලන්ඩ් (AfD) පක්ෂය මෙක්ලෙන්බර්ග් - ෆෝපොමර්න් ප්‍රාන්තයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව දිනාගෙන තිබේ. මෙම පක්ෂය ඉතා වේගයෙන් ජනතා කැමැත්ත දිනාගෙන ඉදිරියට පැමිණෙමින් සිටියි.

කෙසේ වෙතත්, 1990 ජර්මනිය නැවත එක්වීමෙන් පසුව ප්‍රථම වතාවට ජර්මානු අගනුවර නගරාධිපති ධුරයේ බලය ඇල්ලීම සඳහා ඩී ලින්කේ පක්ෂයට අනෙකුත් පක්ෂවල සහාය අවශ්‍ය වනු ඇත.

බර්ලින් නුවරින් 15.3% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් AfD පක්ෂය තෙවැනි ස්ථානයට පත් වූ අතර, 14.3% ක් ලබාගත් ග්‍රීන්ස් (Greens) පක්ෂය ඊළඟ ස්ථානයට පත් විය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (SPD) ලබාගත්තේ 12.1% ක ඡන්ද ප්‍රතිශතයක් පමණක් වන අතර, එය පස්වැනි ස්ථානයට පත්වූයේ බර්ලින් ප්‍රාන්ත මැතිවරණ ඉතිහාසයේ ඔවුන් ලැබූ අතිශය දුර්වලම ප්‍රතිඵලය සටහන් කරමිනි.

මැතිවරණ කොමිෂන් සභාවට අනුව, ඊසානදිග මෙක්ලෙන්බර්ග් - ෆෝපොමර්න් ප්‍රාන්තයේ දී AfD පක්ෂය සති දෙකක් ඇතුළත සිය දෙවැනි ප්‍රාන්ත ජයග්‍රහණය තහවුරු කරගත් අතර, එහිදී ඔවුන් ලබාගත් ඡන්ද ප්‍රතිශතය 38.2කි.

මෙම අන්ත දක්ෂිණාන්ශයේ සහ වාම නැඹුරුවක් සහිත පක්ෂ දෙකේ ජයග්‍රහණයෙන් පෙන්නුම් කෙරෙන්නේ මධ්‍යම රජයේ ප්‍රතිපත්ති කෙරෙහි ජනතාව තුළ ඇති කෝපයයි.

එහෙත් එම කෝපයෙන් ප්‍රයෝජන ගනිමින් සිටින්නේ අන්ත දක්ෂිණාංශිකයන් විසිනි.

AfD පක්ෂයට ඡන්දය දීමට බලපෑ වැදගත්ම හේතුව ලෙස 'සමාජ ආරක්ෂණය, සඳහන් වූ අතර, තෙවැනි ප්‍රධාන හේතුව ලෙස 'යුරෝපයේ සාමය' සලකා තිබුණි. AfD පක්ෂයට ඡන්දය දුන් පිරිසෙන් 36%ක්ම ප්‍රකාශ කළේ තමන් එම පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය නිසා නොව, අනෙකුත් පක්ෂ කෙරෙහි ඇති වූ කලකිරීම හේතුවෙන් ඡන්දය දුන් බවයි. යුක්ත්‍රේන යුද්ධයට සහාය දැක්වීම හේතුවෙන් SPD පක්ෂයේ ඡන්දදායකයන් 48,000 ක් AfD පක්ෂය වෙත ඇදී ගොස් ඇති බව SPD හි ප්‍රධාන අපේක්ෂිකා ෂ්වේසිග් (Schwesig) හට මැතිවරණ රාත්‍රියේදී පිළිගැනීමට සිදුවිය.

ජර්මන් ආණ්ඩුව ආයුධ සහ යුද්ධය වෙනුවෙන් යුරෝ බිලියන ගණනින් වෙන් කරමින් සිටින අතර, විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය සහ අධ්‍යාපන පිරිවැය කප්පාදු කරමින් සිටියි. එමෙන්ම, කර්මාන්ත සහ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ විශාල ලෙස රැකියා අහිමි කරමින්, පොලිස් සහ නිරීක්ෂණ යාන්ත්‍රණය පුළුල් කරමින්, යුද සන්නාහනයන් පිටුවහල් කරමින් සහ ධනවතුන්ගේ ලාභ හා වත්කම් ආරක්ෂා කරමින් සිටියි. ජර්මනියේ ඩොලර් බිලියනපතියන් 200 කට වැඩි පිරිසක් සහ එක් අයෙකුට ඩොලර් මිලියන 100 කට වඩා වත්කම් ඇති ධනවතුන් 5,000ක් සිටින අතර, සමාජයේ පහළම සිටින ජනතාවගෙන් පස්දෙනෙකුගෙන් එක් අයෙක් දිළිඳුකමේ පසුවෙයි.

බ්‍රික්ස් ඇමරිකාව සම්බන්ධව දියාරු ස්ථාවරයක

බ්‍රික්ස් (BRICS) සමූළුවට අයත් රටවල නායකයෝ සැප්තැම්බර් මැදදී නවදිල්ලි නුවරදී හමුවී, ඡේද 140 කින් සමන්විත ප්‍රකාශනයකට ඒකමතිකව එකඟ වී තිබේ. මෙම ප්‍රකාශනය මඟින් පොදු වශයෙන් සාමය සහ සහයෝගීතාව ඉල්ලා සිටී අතර, ඒකපාර්ශ්වික සම්බාධක සහ වෙළඳ බාධක භාවිත කිරීම විවේචනය කළද, එහි ප්‍රධාන නිර්මාතෘ ලෙස ඇමෙරිකානු අධිරාජ්‍යවාදය ලෙස සඳහන් කිරීමට අපොහොසත් වී තිබේ.

2022 දී යුක්ත්‍රේනයට එරෙහිව රුසියාව කළ මිල්ටරි මැදිහත්වීමෙන් පසු ඇමෙරිකාව ප්‍රමුඛ බලවත් පාර්ශ්වයන් විසින් පනවන ලද දැඩි සම්බාධක සහ ලෝකයට එරෙහිව ට්‍රම්ප් පාලනාධිකාරිය ගෙන යන වෙළඳ යුද්ධය හේතුවෙන්, රටවල් ගණනාවක්ම ආර්ථික බලවේගයක් ලෙස බ්‍රික්ස් සංවිධානය දෙසට යොමු වීමට පෙළඹී ඇත. පසුගිය වසර දෙක තුළ තවත් රටවල් පහක් මෙයට එක්විය. ඒ 2024 දී ඊජිප්තුව, ඉතියෝපියාව, ඉරානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය (UAE) මෙන්ම 2025 දී ඉන්දුනීසියාවයි. සෞදි අරාබිය තවමත් එහි සාමාජිකත්වය නිල වශයෙන් තහවුරු කර නොමැත. තවත් රටවල් දහයක් සහකාර රටවල් ලෙස මෙම සමූළුවට සහභාගී විය.

සමූළුවට සහභාගී වූ සියලුම රටවලට ඇමෙරිකාවේ ඒකපාර්ශ්වික තීරුබදු මෙන්ම ඉරානයට එරෙහි ඇමෙරිකානු - ඊශ්‍රායල යුද්ධය නිසා බලශක්ති සැපයුමට සිදු වූ දැවැන්ත බාධා කිරීම් ඍජුවම බලපා ඇත. එසේ වුවද, මෙම දීර්ඝ නවදිල්ලි ප්‍රකාශනය මඟින් ඇමෙරිකාව හෙළාදැකීම් තබා, එහි නම පවා සඳහන් නොකිරීමේ රාජ්‍යතාන්ත්‍රික උපක්‍රමය හරහා සහභාගී වූවන්ගේ විවිධ භූ - දේශපාලනික ස්ථාවරයන් පෙන්නුම් කරයි.

මෙම සමූළුව මැදපෙරදිග තත්වය 'තවදුරටත් උග්‍රවීම' පිළිබඳ 'දැඩි කනස්සල්ල' පළ කිරීමට පමණක් සීමා වූ අතර, සියලුම පාර්ශ්වයන්ගෙන් 'උපරිම සංයමයකින් කටයුතු කරන ලෙස' ඉල්ලා තිබේ.

චීන ජනාධිපති ෂී ජින්පින් වසර හතකට ආසන්න කාලයකට පසුව තම පළමු ඉන්දීය සංචාරයේ නිරත විය. නමුත් වොෂින්ටනය සමග ඇති උපායමාර්ගික සබඳතා Quad වැනි සන්ධාන හරහා ඇමෙරිකාවේ මිත්‍රයන් වන ජපානය සහ ඕස්ට්‍රේලියාව සමග පවතින සමීප සබඳතා ඔස්සේ, චීනයට එරෙහි යුද්ධය සඳහා ඇමෙරිකාව වේගවත් කරමින් සිටින සූදානමට ඉන්දියාව ද එකතු වී සිටින බව නොරහසකි.

2030 වන විට වසරකට ඩොලර් බිලියන 100ක ද්විපාර්ශ්වික වෙළඳ ඉලක්කයක් කරා ළඟා වීම සඳහා, රුසියානු ආයුධ ඉන්දියාවට අලෙවි කිරීම වැඩි කිරීම ඇතුළුව දෙරට අතර පවතින දිගුකාලීන ආර්ථික හා උපායමාර්ගික සබඳතා ශක්තිමත් කරගැනීමටත්, රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පුටින් හමුවිමටත් මෝදි මෙම අවස්ථාව භාවිත කර තිබේ. රුසියානු තෙල් ආනයනය නතර කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් වොෂින්ටනයෙන් එල්ල වූ සැලකිය යුතු පීඩනය සහ ඉන්දියාවට එරෙහිව ඇමෙරිකාව විසින් පනවන ලද දැවැන්ත තීරුබදු හමුවේ පවා, රුසියාව යුක්ත්‍රේනය ආක්‍රමණය කිරීම හෙළාදැකීම මෝදි ප්‍රතික්ෂේප කර ඇත. සුවිශේෂී කරුණ නම්, රුසියාවට එරෙහිව යුක්ත්‍රේනය තුළ ඇමෙරිකාව සහ නේටෝව (US - NATO) ගෙන යන උග්‍රවන යුද්ධය පිළිබඳව නවදිල්ලි ප්‍රකාශනයෙන් සම්පූර්ණයෙන්ම මගහැර තිබීමයි.

ට්‍රම්ප්ගේ ඒකපාර්ශ්වික තීරුබදු හේතුවෙන් අඩු වැඩි වශයෙන් බ්‍රික්ස් හි සියලුම සාමාජිකයන්ට පහර වැදී ඇත. පසුගිය වසරේ රියෝ ද ජැනෙයිරෝ හිදී බ්‍රික්ස් සමූළුව රැස්වෙද්දී, බ්‍රික්ස්හි 'ඇමෙරිකානු විරෝධී ප්‍රතිපත්ති' සමඟ පෙළගැසෙන ඕනෑම රටකට අමතර 10%ක තීරුබදු පනවන බවට අසාමාන්‍ය තර්ජනයක් කරමින් ට්‍රම්ප් සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රහාරයක් එල්ල කර තිබුණි. බ්‍රික්ස් සමූළුවේ ඇමරිකාව සම්බන්ධ දියාරු ස්ථාවරයට මෙයද හේතු වෙන්නට ඇත.

කෙසේවෙතත් අධිරාජ්‍යවාදී බලවතුන්ගේ කොල්ලකාරී ක්‍රියාවන්ට එරෙහි වීමට සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ඇතුළු ගෝලීය ආයතන තුළ වැඩි බලයක් ඉල්ලා සිටීම සඳහා 'බහුපාර්ශ්විකත්වය සහ බහු-ධ්‍රැවීයතාව ශක්තිමත් කිරීමට ඇති කැපවීම' බ්‍රික්ස් සමූළුව නැවත වරක් අවධාරණය කර තිබේ. මතුවෙමින් පවතින ලෝක යුද්ධය හමුවේ, විවිධ වූ භූ දේශපාලනික හා ආර්ථික නානාප්‍රකාර අභිලාෂයන්ගෙන් බෙදී ගිය නවදිල්ලියේ බ්‍රික්ස් හමුව, ඇමෙරිකානු අධිරාජ්‍යවාදයේ සහ එහි මිත්‍රයන්ගේ අපරාධකාරී ක්‍රියාවන්ට එරෙහිව පැහැදිලි ස්ථාවරයක් ගැනීමට ඇති නොහැකියාව පෙන්නුම් කර ඇත.

චම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

2026 ඔක්තෝබර්



'ජඩ බදු හකුලා ගනිව් ! ජීවන බර පහත දමව් !' යන තේමාවෙන් ජන අරගල ව්‍යාපාරය විසින් ඔක්තෝබර් 3 වැනිදා කොළඹදී පැවැත්වූ 'ජනප්‍රතිරෝධය' පාගමනේ අවස්ථාවක්



තානාපතිනි පැට්‍රීෂියා ලාසරා පේගෝ ගෙරා සහෝදරියගේ ආරාධනයකට අනුව පක්ෂයේ ජාත්‍යන්තර සබඳතා කමිටු නියෝජිතයන් ඇය සමග සුහද හමුවීමකට එක් වුණි. එම අවස්ථාවේ එක්සත් ජනපදයේ කියුබාව වටලෑම, විශේෂයෙන් බලශක්ති වටලෑම යළි ක්‍රියාත්මක කිරීමෙන් පසු කියුබාවේ සමාජ-ආර්ථික හා දේශපාලන තත්වය පිළිබඳ නව කරුණු ඇය විසින් පැහැදිලි කරණ ලදී.









YOUTH FOR CHEnge සංවිධානය කළ CHE DAY 2026 සමරු වැඩසටහන ඔක්තෝබර් 08 දින බද්දේගම නගර ශාලා පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී ළඟිරු වීරසේකර සහෝදරයා සහ කියුබානු තානාපතිනිය අදහස් පළ කරණ ලදී.



'22: JRගෙ පඩංගුවට තවත් අණ්ඩයක්' යන තේමාවෙන් 22වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් පැවැත් වූ සම්මන්ත්‍රණයේ අවස්ථා







ළමා සුරක්ෂිතතාව තහවුරු කිරීමට අදාළව 'නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය' විසින් කෙටුම්පත් කළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළත් යෝජනා මාලාවක් පිළිබඳ සාකච්ඡාවක් 'ළමා සුරක්ෂාව සඳහා සමාජ සම්මුතියක්' යන තේමාවෙන් සැප්තැම්බර් 30 වැනිදා පැවැත්වුණි. මෙම සාකච්ඡාව සඳහා දේශපාලන ක්‍රියාකාරීන් සහ සමාජ ක්‍රියාකාරීන් පිරිසක් සම්බන්ධ වූහ.



ලලිත් සහ කුගන් සහෝදරවරු දෙදෙනා පැහැරගෙන ගොස් අතුරුදන් කිරීම සම්බන්ධයෙන් පෙරටුගාමී සමාජවාදී පක්ෂය පැවරූ නඩුවට අදාළව මාර්ගගත ක්‍රමයට සාක්ෂි දීම සඳහා එවකට ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සැප්තැම්බර් 29 දා කොළඹ අලුත්කඩේ අධිකරණ සංකීර්ණයට පැමිණියේය. යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාගයට ගත් එම නඩුව පදනම් කරගෙන, සියළු අතුරුදන් කිරීම් පිළිබඳ සත්‍යය හෙළිකරන ලෙස බලකරමින් අලුත්කඩේ අධිකරණ සංකීර්ණය ඉදිරිපිටදී නිහඬ උද්ඝෝෂණයක් සංවිධානය කර තිබිණි.





පක්ෂ අරමුදල තර කිරීමත් වත්මන් දේශපාලන තත්වය සම්බන්ධයෙන් ජනතාව අතරට දේශපාලන සංවාදයක් ගෙන යාමත් අරමුණු කරගෙන පක්ෂයේ සහෝදර සහෝදරියන් විසින් සැප්තැම්බර් මස පැවැත්වූ කැට ව්‍යාපාරයේ අවස්ථා